විජය - ගුණසේන
පොත් ලියන ඉස්කෝලේ | 2019

# දෙල් ගහ යට පුංචි ගෙදර

ශ්‍යාමිලා ඉන්දීවරී තිලකරත්න

ගුණසේන

Scanned by CamScanner

සීමාසහිත ඇම්.ඩී.ගුණසේන සහ සමාගම
217, ඕල්කොට් මාවත, කොළඹ 11.
දුරකථනය 2323981-4 ෆැක්ස් 2323336 ඊමේල් info@mdgunasena.com
www.mdgunasena.com

© ශ්‍යාමිලා ඉන්දීවරී තිලකරත්න

ප්‍රථම මුද්‍රණය 2019

ISBN 978 - 955 - 21 - 2901 - 8

ප්‍රකාශකගේ ලිඛිත අවසරය කලින් තිසි පරිදි නොලබා මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කුමන ආකාරයකින් හෝ කුමන ක්‍රමයකින් ඉලෙක්ට්‍රොනිකව, යාන්ත්‍රිකව, ඡායාපිටපත් මගින් සම්ප්‍රේෂණය සහ භාවිතය පිණිස කිසියම් පද්ධතියක සටහන් කිරීම හා ගබඩා කර තැබීම සපුරා තහනම්ය.

මුද්‍රණය
සීමාසහිත ඇම්.ඩී.ගුණසේන මුද්‍රණකරුවෝ සහ (පුද්ගලික) සමාගම
20, සාන්ත බස්තියම් කන්ද, කොළඹ 12. R - P/2 - 2110 - 09/2019

Scanned by CamScanner

# ප්‍රකාශක සටහන

කියවන්නට, ලියන්නට, හිතන්නට ලැදි නිර්මාණාත්මක ජන සමාජයක් බිහිකිරීමේ හෘදයාංගම අරමුණින් විජය පුවත්පත සමඟ එක්ව පොත් ලියන ඉස්කෝලේ ව්‍යාපෘතිය අපි ආරම්භ කළෙමු. පාසල් දූ දරුවන්ටත්, පාසල් ගුරුභවතුන්ටත් තම ලේඛන කුසලතාව අවදිකරමින් යොවුන් නවකතා නිර්මාණය කිරීමට අවශ්‍ය මාවත විවර කරදීම මෙහි මූඛ්‍ය අරමුණයි.

ඒ අනුව විජය මාධ්‍ය ජාලයෙන් අප කළ ඉල්ලීමට දිවයිනේ දසතින් බොහෝ අත්පිටපත් ගලා එන්නට විය. ඒ අතරින් සුවිශේෂ අපූර්වත්වයක් පෙන්වූ යොවුන් නවකතා ත්‍රිත්වයක් අපි තෝරා ගත්තෙමු.

නිපුනි චන්ද්‍රසෝම සිසුවියගේ දොස්තර පිනී සමග විදේශීය නේවාසිකයා, ගෙත්මිණි ප්‍රියංවදා වැලිකල සිසුවියගේ විලාප දෙන ගොවිපළේ වික්‍රමය සහ ශ්‍යාමිලා ඉන්දීවරී තිලකරත්න ගුරුතුමියගේ දෙල් ගහ යට පුංචි ගෙදර යන නිර්මාණ ඒ අතර වෙයි.

විජය ගුණසේන පොත් ලියන ඉස්කෝලේ ව්‍යාපෘතියෙන් කළඑළි දකින මෙමා අපූරු නිර්මාණ ත්‍රිත්වය කියවා රසවිඳීමට අපි ඔබට ඇරයුම් කරමු.

ප්‍රකාශන කළමනාකරු
ඇම්.ඩී.ගුණසේන සහ සමාගම

Scanned by CamScanner

# විජය ප්‍රකාශක සටහන

අවුරුදු හතළිහක් පුරා දැයේ දරුවන්ට ලෝකය ගැන කියා දෙන්නට, ලෝකයේ ජීවත් වන හැටි කියා දෙන්නට, ජීවිතයට ආදරය කරන්නට කියා දෙන්නට ''විජය'' පවුලේ කැපවීම සඵල වීම ගැන අද අපට සතුටු විය හැකිය.

දරුවන්ගේ විවිධ හැකියාවන්ට අත හිත දුන් ''විජය'' හතළිස් වැනි වියේදී පොත් ලියන ඉස්කෝලේ තුළින් ලියන දරුවෝ මෙන්ම ලියන ගුරුවරුද අවදි කරන්නට ගත් උත්සාහය අද මල්පල ගැන්වී ඇත.

ලිවීමේ හැකියාව සැමදෙනාට ම ඇතත්, කතාන්දරයක් මුල මැද අග එකට පෙළ ගස්වා, කියවන්නට රුචි ලෙස ලිවීමේ හැකියාව සැමදෙනාට ම නැත. ඒ අරුතින් ගත් කල විජය ගුණසේන පොත් ලියන ඉස්කෝලේ මඟින් පොත් ලියන ගුරුවරුන් හා දරුවන් කිහිප දෙනෙකු කළ එළි බසින මේ අවස්ථාව සැමට සතුටු විය හැකි කරුණකි.

පුවත්පතක් ලෙස තම පාඨක ප්‍රජාව වෙනුවෙන් සීමාවන් ගෙන් ඔබ්බට යමින් නව මංපෙත් විවර කරමින් දැයේ දරුවන්ගේ කුසලතාවට ඉඩහසර ලබාදීමට හැකිවීම භාග්‍යයක් කොට සලකමි.

දුමින්ද සංජීව බාලසූරිය
විජය කර්තෘ
2019 සැප්තැම්බර් 20

Scanned by CamScanner

# පෙරවදන

''දෙල් ගහ යට පුංචි ගෙදර'' මගේ කුළුඳුල් කෘතියයි. 'විජය' පුවත්පත සහ ඇම්.ඩී.ගුණසේන සමාගම අත්වැල් බැඳ ගනිමින් දියත් කළ ''පොත් ලියන ඉස්කෝලේ'' ව්‍යාපෘතියේ තවත් එක් සොඳුරු ප්‍රතිඵලයක් ලෙස ''දෙල් ගහ යට පුංචි ගෙදර'' හඳුන්වා දීමට කැමැත්තෙමි. මාගේ කුළුඳුල් කෘතිය, මෙකී ආයතන දෙකෙහි අතදීමෙන් ඔබ අතට පත් කරන්නට ලැබීම මා ලද මහගු භාග්‍යයකැයි සිතමි.

කුඩා කල, මා ලියූ කවි එකතුවක් ද රැගෙන මගේ තාත්තා දිනක් මා විජය පුවත්පත් කාර්යාලයට කැටුව ගිය දින මට අද මෙන් මතකය. එවකට 'විජය' ළමා පුවත්පතේ කර්තෘ ධුරය දැරූ දෙල්තොට චන්ද්‍රපාල මහතා මගේ කවි කියවා බෙහෙවින් අගය කොට විජය ළමා පුවත්පතේ පළ කිරීමට භාරගත්තේ මට පුංචි කතන්දර පොතක් ද තිළිණ කරමිනි. විජය පුවත්පතේ මගේ කවියක් පළවූ මුල්ම දිනය, මගේ නිර්මාණ දිවියේ සුවිශේෂී සන්ධිස්ථානයක් බවට පත් විය.

එමෙන්ම, කොළඹ ඇම්.ඩී.ගුණසේන මහා පොත්හල පිළිබඳව මගේ කුඩා කල මතකයද එතරම්ම සුන්දරය. නිතරම, තාත්තාගේ අතේ එල්ලී ගුණසේන පොත්හලට ගොඩවන කුඩා මා විස්මයෙන් ඇළලී ගිය කරුණු දෙකක් විය. එකක් නම්, බිම් මහලේ තිබූ අලංකාර සුවිසල් වතුර මලයි. දිය ඇල්ලක හඬ නංවමින් නොකඩවා පහළට ඇද හැලුණු දිය දහර, මගේ පුංචි සිතේ ඇති කළේ කුතුහලය මුසු සොම්නසකි. අනෙක්

Scanned by CamScanner

# 01

## සුන්දර බක්මීයාය

බක්මීයාය කියන්නේ කඳු වැටියකින් වටවුණු ලස්සන පුංචි ගම්මානයක්. කඳුවැටියටත් කුඹුරු යායටත් අතරින් පිහිටලා තිබුණු බක්මීයායට නම හැදුණේ කඳුවැටිය අතරින් ගලා ගිය දොළ පාරේ ඉවුරුවල තිබුණු රූස්ස බක්මී ගස් නිසා කියලයි ගමේ වැඩිහිටියෝ කිව්වේ. බක්මී මල් පිපෙන කාලයට මුළු ගම්මානයම සුවඳයි. පුංචි පුංචි සුදු පාට රේණු පිරුණු කහ පාට බෝල වගේ බක්මී මල් දොළ පාරට වැටිලා පහළට ගහගෙන යද්දි බලන්න හරි ලස්සනයි.

කඳුවැටිය පාමුලට වෙන්න තමයි බක්මීයායෙ ගංගොඩ තිබුණේ. ඒ කියන්නේ පුංචි ගෙවල් ගොඩක් එක පොකුරට හදල තිබුණා. හැම ගෙදරකම වාගේ මිදුලේ දාස්පෙතියා, රාජපොහොට්ටු, සමන්පිච්ච, කුඩලු වගේ මල් වර්ග වවලා තිබුණා. හැමදාම මේ මල් ගස්වල පාට පාට මල් පිපුණා. ඉතින් හැම උදයේම පුංචි සමනලුන් මී මැස්සන් පැණි කුරුල්ලන් මේ මල්වල පැණි බොන්න පියඹා ආවා.

තිල්වන් කඳුවැටියෙන් එබී බලන ළා හිරු කිරණ



Scanned by CamScanner

කුඹුරේ ගොයමට වැටිලා පිනි බිංදු මුතු පලසක් වගේ දිලිසෙනවා. සීත සුළං රැළි ගම පුරාම හමා යන්නේ මල් සුවඳත් අරගෙනමයි.

මේ උදෑසන සිරියාවෙනුත්, කුරුලු කිචිබිචියෙනුත් ගම්මානය පිබිදෙද්දී ඔන්න පුංචි දරුවොත් පාසල් යන්න සූදානම් වෙනවා. සුදු ඇඳුමින් සැරසිලා බත් කටකින් දෙකකින් කුස පුරවගෙන දෙමාපියන්ටත් ගෙදර ඉන්න අනිත් වැඩිහිටියන්ටත් වැඳලා තමයි ඔවුන් පාසලට පිටත්වෙන්නේ.

වෙල්යාය දිගේ වක්කඩවල් පනිමින්, නියරවලින් එගොඩ වෙමින් සුදු කොක්කු පෙළක් වගේ පාසල් යන පුංචි දරුවො පෙළ බලන්න ලස්සනයි.

වෙල්යායේ මහ නියර දිගේ ගිහින් දොළ පාර හරහා ඒදණ්ඩෙන් එගොඩ වුණාම ආයෙත් වෙල්යායක්. ඒ වෙල්යාය ඉස්මත්තේ පුංචි කඳු ගැටයක් උඩ තමයි ගමේ පාසල තියෙන්නේ. මේ පාසලත් ගම්මානය වගේම පුංචියි. මුළු පාසලටම තියෙන්නේ ගොඩනැගිලි දෙකක් විතරයි.

02

# පුංචි යාළුවෝ

සඳුන්, මලිත්, තාරක, සතුලි, නිපුනි කියන්නේ මේ ගමේ ඉන්න පුංචි යාළුවෝ කිහිපදෙනෙක්. එයාලා ඉගෙන ගන්නෙත් එකම පන්තියේ. මේගොල්ලො පාසල් යන්නෙත් සෙල්ලම් කරන්නෙත් එකටමයි. ඒගොල්ලෝ හැම ඉරිදා උදේම ලස්සන මල් වට්ටි හදාගෙන දහම් පාසල් යනවා. ගමේ පන්සල තියෙන්නේ ගම කෙළවර තියන වැව අයිනේ කුඩා ගල් තලාවක් උඩයි. ඕළු, නෙළුම් මල් පිපුණු වැව් තලයට උඩින් පුංචි දාගැබ සුදෝසුදට කිරි බුබුළක් වගේ ඈතට පේනවා. ගල්තලාව මැදින් ගල් පඩි පෙළක් දිගේ තමයි උඩට නගින්න තිබුණේ. පඩි පෙළ දෙපැත්තේ තිබුණු ලොකු අරලියා ගස්වලින් වැටුණු මල්, පඩිවල තැනින් තැන රැඳිලා. වැවෙන් හමාගෙන එන සීතල සුළං රැළිවල එතිලා ආපු නෙළුම් මල් සුවඳට අරලියා මල් සුවඳත් එකතු වෙලා පන්සල පුරාම පැතිරිලා.

පන්සල පිටිපස්සේ තිබුණේ කුඩා කැලයක්. ගමේ වැඩිහිටියෝ බෙහෙත් පැළෑටියක්, මුල් ටිකක්, කොළ, පොතු ටිකක් හොයාගන්න යන්නේ මේ කැලෑවට



Scanned by CamScanner

තමයි. ඒ වගේම මේ කැලෑවේ දං, හිඹුටු, බෝවිටියා, කීන, කරඹ, කොහු කිරිල්ල වගේ ගඩා ගෙඩි ජාති ඕනෑ තරම් තිබුණා. පන්සල් වත්ත මායිමේ ඉඳන් කැලෑව මැදින් තියන අඩිපාර ඉවර වෙන්නේ ඇහැටුයාය වෙල්යායෙන්. ඇහැටුයාය කියන්නේ බක්මීයායට අසල්වැසි ගම්මානයක්. ඇහැටුයාය ඇළේ ඉවුර දිගේ ගිහින් බක්මීයායෙ කඩමණ්ඩියට යන්න පුළුවන්. හැබැයි, කැලේ මැද්දෙන් යන්න තියෙන නිසා බක්මීයායෙ ගොඩක් අය පන්සලට මේ පාරෙන් ගියේ නැහැ.



Scanned by CamScanner

03

# මහ වැස්සක්

පුංචි යාළුවන්ට පාසලේ වාරාවසාන නිවාඩුව ලැබුණේ පෙරේදායි. දිග නිවාඩු කාලයක් ලැබුණු එක ගැන හරිම සතුටින් තමයි කවුරුත් හිටියේ. අද දහම් පාසලුත් නිවාඩු දෙන බව උදේ රැස්වීමේදී ලොකු හාමුදුරුවෝ කීවාම කාගෙත් සතුට දෙගුණ තෙගුණ වුණා. දහම් පාසලේ ළමයි සමහරදාට දහම් පාසල් ඇරිලා දං, හිඹුටු කඩන්න කැලේට යනවා. අද නිවාඩු දෙන හින්දා ආයෙ මාසෙකටවත් හිඹුටු කඩන්න යන්න වෙන්නේ නෑ. ඒ හින්දා යාළුවො ටික කතා වුණා අද දහම් පාසල් ඇරුණාම කැලේට යන්න. අද නිවාඩු දෙන දවස නිසා වෙනදාට කලින් දහම් පාසල අවසන් වුණා.

හෙමින් හෙමින් කැලේට රිංගපු යාළුවන්ට කාලය ගතවෙන බවක් දැනුණේම නෑ. කතාවෙන් කතාවෙන් දං, හිඹුටු, ඇඹුල් පේර වගේ ගෙඩි කඩ කඩා කන ගමන් දන්නෙම නැතුව කැලේ හුඟක් දුර ඇවිල්ලා.

කැලේ ඇතුළෙ කොහොමත් අඳුරු නිසා යාළුවන්ට නොදැනුණාට, මේ වෙලාවේ අහස, මහා වැස්සකට



Scanned by CamScanner

සූදානම වෙමින් තමයි හිටියේ. හිටි හැටියෙ හමාගෙන ආපු මහා හුළඟින් ගස් ඇඹරෙන්නත්, කුරුල්ලෝ කෑ ගහන්නත්, අඳුරු කැලෑව තවත් අඳුරු වෙන්නත්, පටන් ගත්තා.

"අනේ මහ වැස්සක් එන්නයි යන්නේ ! දැන් අපි මොකද කරන්නේ?" සනුලි බයෙන් වටපිට බැලුවා. "හරි... හරි... බයවෙන්නෙපා... අපි ඉක්මනට මේ කැලෙන් පිටවෙන්න විදියක් බලමු" තමනුත් ටිකක් බයවෙලා හිටියත් ඒ බව නොපෙන්වා සඳුන් කීවේ යාළුවන්ගෙ බය නැති කරන්නයි. "හරි... මං අහලා තියනවා, අපේ කිරි අත්තා කියනවා, මේ කැලේ මැද්දෙන් තියන අඩි පාර ඉවර වෙන්නේ එහා ගමේ මහ ඇළ ගාවින් කියලා. ඒ ඇළ ඉවුර දිගේ ගියාම, අපේ කුඹුර පහළ ඕවිටටලු වැටෙන්නේ. හැරෙන්නෙ නැතිව දිගටම ගියාම බක්මීයායෙ කඩමණ්ඩියලු." තාරක කිව්වේ දැනමුත්තෙක් වගේ.

"එහෙනම් අපි ඉක්මනට මේ අඩි පාර දිගේ දුවමු කැලේ එහා පැත්තටම" තාරක කිව්වේ අඩියක් ඉස්සරහට තියන ගමන්. "ඒත් අපි හරියටම ඒ පාර දන්නෙ නැනේ..." නිපුනිට නම් තාම ටිකක් බයයි වගේ. "අයියෝ... බය වෙන්නෙපා... අපේ කිරි අත්තලා බේත් ජාති හොයන්න ආවාම ඔය පාරෙන් ඕන තරම් ගිහින් තියනවාලු." තාරක පෙරමුණ ගනිමින් කිව්වා.

"එකායි, දෙකායි, තුනා...යි !" යාළුවො හැමෝම පොත් ටික කිටි කිටියෙ ඇඟට තදකරගෙන හයියෙන් දුවන්න පටන් ගත්තා. ඒ වෙනකොටත් වැස්ස පටන් අරන් තිබුණත්, කැලේ තිබුණු මහ ගස් නිසා එයාලව වැඩිය තෙමුණෙ නෑ. කොහොම කොහොම හරි



Scanned by CamScanner

වේගෙන් දුවගෙන ආපු යාළුවෝ ටිකට තාරක කිවුවා වගේම කැලේ අඩි පාරඉවරවුණේ වෙල් යායක් අයිනෙන් ගලන ඇළ ඉවුරකින් බව පෙනුණා. කට්ටියම ආයෙ දෙපාරක් හිතන්නේ නැතිව ඇළ හරහා දාලා තිබුණු පොල් කොට ඒදණ්ඩෙන් එහා පැත්තට දුවගෙන ගිහින් ඇළ ඉවුර දිගේ දුවන්න ගත්තා.

හැබැයි ඒ වෙනකොට, වෙල්යායෙ එහා ඉම පේන්නෙ නැති තරමට වැස්ස තද කරලයි තිබුණේ. අනේ ! පුංචි යාළුවෝ ටික හොඳටම තෙමුණා. වෙල්යාය අයිනෙ ඇළ ඉවුර නිසා මුවාවෙන්න කියලා එහෙමට ලොකු ගහක්වත් ළඟපාතක නෑ. ඇළ ඉවුර දිගේ ඔහොම දුවගෙන යනකොට පේළියෙ මුලින්ම දුවපු තාරක දැක්කා ඇළේ අනිත් පැත්තට යන්න පොල් කොට දෙකක් දාලා හදපු පුංචි ඒදණ්ඩක්. ඒදණ්ඩෙ එක පැත්තක ලීවලින් අත්වැටකුත් ගහලා. මොහොතක් ඒදණ්ඩ ළඟ නැවතුණු යාළුවෝ ටික දැක්කා ඇළෙන් එහා පැත්තෙ පුංචි ගෙයක්. ආයෙ හිත හිතා ඉන්නෙ මොකටද? කට්ටියම දුවගෙන ගියා ගේ දොරකඩටම.



Scanned by CamScanner

04

# ආදරයේ සත්කාරය

කටුමැටි ගහපු පුංචි ගෙදර පිලේ වාඩිවෙලා අත්තම්මා කෙනෙක් පැදුරක් වියනවා. කළු, සුදු පුල්ලි වැටුණු පූසෙක් අත්තම්මා වියන පැදුරේ පන්ගස් එක්ක සෙල්ලම් කරනවා. හැබැයි, අවසරයක් නැතිව තෙමීගෙන ගෙදරට කඩාවැදුණු පුංචි අමුත්තන්ට, කලුම කලු පාට බලුහාමි නම් මහා හයියෙන් බුරන්න පටන් ගත්තා.

''හා... හා... කලුමහත්තයා,ඔය සද්දෙ නවත්තගනින්... මේ පැටව් මේ වැස්සට ගෙට ගොඩවුණේ'' කියමින් බිමට අතක් තියලා හෙමිහිට නැගිට්ටා. ''ගෙට එන්න පැටවුනේ... මයෙ අප්පේ.. හොඳටම තෙත බරියං වෙලා. හිටින්ට... හිටින්ට.. මං පිහින්න මුකුත් අරන් එන්නං'' කියමින් අත්තම්මා ඉක්මනට ගෙට ගියා. සනුලිට එක්වරම මතක් වුණේ ඉස්කෝලෙදි කියවපු කතා පොතක තිබුණු කතන්දරයක්. කැලේ අතරමං වුණු ළමයි දෙන්නෙක් මේ වගේ පුංචි ගෙයක් දැකලා ඇතුළට ගියාම නපුරු මන්තරකාරියෙක් අල්ලගෙන හිරකරගත්ත කතාව. සීතලටත් වඩා ඇයව වෙවුලන්න වුණේ ඒ කතාව මතක් වෙලා ඇතිවුණු බයටමයි.



Scanned by CamScanner

ගේ ඇතුළෙ කිසිම දෙයක් එළියට පේන්නෙ නැති තරමට කරුවලයි. අත්තම්මා ගෙනාපු රෙද්ද හැමෝගෙම මූණට අල්ලලා යාළුවො හැමෝම සිහිනැතිව වැටෙනවා සනුලිට මැවිලා පෙනුණා. 'බුදු අම්මෝ' කියලා හයියෙන් කෑගහන්න ඇරපු කට අතකින් වහගන්න ගමන් ''අපි ඉක්මනට මෙතනින් පැනගම්මු'' කියලා අනිත් අයට කෙඳිරුවා. සනුලි එහෙම කියන්නේ ඇයි කියලා හිතන්නත් කලින් අත්තම්මා රෙද්දක් අරන් එළියට ආවා. සනුලිගේ මුළු ඇඟම බයෙන් වෙවුලන්න ගත්තා. 'අනෙ අප්පේ... මේ දරුවට හීතලේ අල්ලලද කොහෙද වෙවුලනවා... කෝ හිටින්ට දරුවෝ.. මං පිහදාන්නම්'' කියපු අත්තම්මා සනුලිගේ හිසේ තෙත මාත්තු කරන්න පටන් ගත්තා. සනුලිත් ඕනෑ දෙයක් වෙද්දෙන් කියලා හිතාගෙන ඇස් දෙක තදින් පියාගත්තා. සනුලිගෙන් පස්සෙ අනිත් යාළුවන්ගෙත් හිස්වල තෙත මාත්තු කරපු අත්තම්මා තෙත රෙද්ද බිත්තියයි කණුවකුයි අතර ගැටගහලා තිබ්බ වැලේ වැනුවා. තාමත් එක සීරුවට වහිනවා.

''පැටවුනේ, ඔහොම ඉඳගන්ට... මං කෝපි ඩිංගක් වක්කොරාන එන්නං හීතල යන්ට..'' කියමින් අත්තම්මා ආයෙමත් ගේ ඇතුළට ගියා.

''ඈ සනුලි, ඔයාට එක පාරටම මොකද අනේ වුණේ?'' නිපුනි ඇහුවා. ''නෑ අනේ, මොකුත් නෑ, මට එකපාරටම බය හිතුණා.'' ''මං හිතුවෙ මෙයාට ජලසන්නිය හැදිලා වෙවුලනවා කියලා.'' තාරක හිනාවෙන්න ගත්තා.

එක දිගට බුරලා හති වැටුණු කලු මහත්තයා



Scanned by CamScanner

පිලේ පැත්තකට වෙලා. යාළුවො ටික වටපිටාව දිහාට ඇස් යැවුවා. දැන් නම් වැස්ස ටිකක් අඩුවෙලා වගේ. ඇලේ වතුර බොර පාටට වේගෙන් ගලාගෙන යනවා. මිදුලේ මුළු වත්තම හෙවණ කරන මහ විශාල ගහක්. ඊටත් එහා තිබුණු පුංචි මඩුවක එළදෙනකුයි පැටියෙකුයි බැඳලා හිටියා.

"මෙන්න පුතාලට මං පොඩි කෑමක් ගෙනාවා හප හපා කෝපි බොන්න... බලන්නකෝ රසද කියලා" කියමින් ආපු අත්තම්මා මොනවදෝ ඇට ජාතියකින් පුරවපු පුංචි අතුල්පතක් යාළුවන්ට දුන්නා. හැමෝම එයින් ඇට දෙකතුනක් අරගෙන කටේ දාගත්තා.

කොස් ඇට වගේ පෙනුණත්, ඒ කොස් ඇට නොවන බව හපනකොටම කට්ටියට තේරුණා. "ම්... කවදාවත් දැනුණෙ නැති රසක්..." බැදපු ඇට රටකජු වගේ හැපෙන අතරේ දිවට පැණි රසකුත් දැනුණා. හැමෝම ආයෙ ආයෙත් මේ රසම රස ඇට ජාතිය ටික ටික අරන් හපන්නට වුණා.

"රසයිද පුතේ?" අත්තම්මා ආසාවෙන් ඇහුවා. 'රසයි' කියාගන්නවත් බැරි තරමට පුංචි කටවල් පිරිලා තිබුණේ. 'ඔව්' කියන්න ඔළුව වනමින් යාළුවො ටික ඉතිරි ඇට ටිකටත් වග කිව්වා. අත්තම්මා හිනාවෙමින් පුංචි බෙලෙක් කෝප්පවලට ජෝගුවෙන් කෝපි වක්කරමින් දරුවන්ට දුන්නා.

"මොනවද අත්තම්මෙ මේ...? හරිම රසයි... අපි නම් කවදාවත් කාල නෑ" ඒ තාරකා. "ඔය තමයි පුතේ බැදිදෙල්. පුතාලට පේනව නේද අර මිදුලේ තියන ලොකු ගහ? ඒ ගහේ ඇට බැදලා

පැණි දාලා තමයි බැදි දෙල් හදන්නේ. හැබැයි ඒ ගහට කියන්නෙ කැළෑ දෙල් කියලා. ඕවා වැඩිපුර හැදෙන්නේ කැළෑවල හින්දයි එහෙම කියන්නේ'' හැමෝම පෙරටත් වඩා උනන්දුවෙන් කැලෑ දෙල් ගහ දිහා බැලුවා.

බැදිදෙල් ඇටයක්වත් නැතිව හිස් වුණු අතුල්පත අත්තම්මට දෙන ගමන් ''අත්තම්මා මේ ගෙදර ඉන්නෙ තනියමද?'' තිපුනි ඇහුවා. ''අනේ පුතේ මට මොන තනියක්දැ? ඔය කලුමහත්තයයි සේතියයි ඉන්නකොට...''

''එතකොට අත්තම්මගෙ පවුලෙ වෙන කවුරුත්ම නැද්ද?''

''මයෙ පුතාල දෙන්නයි දුවයි ඉන්නේ කොළඹ. ඒ දරුවො එහෙ රස්සාවල් කොරනවා. දරුවන්ගෙ අප්පොච්චි මියැදිලා නම් දැන් අවුරුදු පාළොහක් විතර වෙනවා... දරුවන්ගෙන් බේරෙන්න බෑ පුතේ කොළඹ ඇවිත් නවතින්න කියලා... ඒත්... අපෙ අප්පේ.. මට නම් ඔය දීපංකරේ ගිහින් ඉන්න බෑ. එක දවසක්වත්... නින්ද යන්නෑ රස්නෙටයි, වාහන සද්දෙටයි... ඒ විතරක්ද... මදුරු කන්දරාව... මුළු කාමරේම සීතල කොරන්න මොකක්දෝ මැසිමක් තියෙනවා. ඒකෙ සීතලට ගල් වෙනවා පුතේ... අනික අපේ දරුවො කන්නෙ වැඩිපුර කඩ කෑම... බොන්නෙ පයිප්පෙන් එන මොනවද බේත් ජාතියක් දාපු වතුර... මට වෙලාවකට දුකත් හිතෙනවා පුතේ, ඒ දරුවො ගැන... මට නම් මේ ඇළෙන් නාගෙන, මේ ගහක, වැළක හැදෙන ගෙඩියක්, කොළයක්, අලයක් උයා පිහාගෙන කාලා, පිනක් දහමක් කරගෙන ඉන්න එක දාහෙන්



Scanned by CamScanner

සම්පතයි පුතේ.. ඒ දරුවො විඩෙන් විඩේ එනව මාව බලල යන්න. මේ ඊයෙත් ලොකු පුතා ඇවිත් අද උදේ තමයි ගියේ... ඔය බැදි දෙල් මං ඒ දරුවන්ට ගෙනියන්න හදලා ඉතුරු වෙච්චා...''

''ඉතින්... ආත්තම්මට බය නැද්ද තනියම ඉන්න'' කොහොමටත් පොඩ්ඩ ඇත්තම් බයවෙන සනුලි ඇහුවා. ''අනේ මොකට බයවෙන්නද පැටියො, මේක මං උපන් මයෙ මහගෙදර.. ඒ පරණ ගේ නම් කඩත් වැටිලා හුග කල්. මෙතනමයි ඒකත් තිබුණේ. මෙච්චර කල් අපූරුවට හිටිය වගේ මේ ටිකත් ඉන්න මොන බයක්ද? අනික පුතේ, අපි කුරා කුහුඹියෙකුටවත් වරදක් කරන්නැත්නං අපටත් කිසි කරදරයක් වෙන්නෙ නෑ... ඒක නෙමෙයි පැටවුනේ.. මෙච්චරලා මං ගැන කිව්වා මිසක් මේ දරුවො කොහෙද කින්ද මන්ද කියලා අහන්නවත් බැරිවුණානොවැ''

''අත්තම්මෙ, අපි බක්මීයායෙ, අද දහම් පාසල් කලින් ඇරපු නිසා අපි හිඹුටු කඩන්න කැලේට ගියා. ඒ වෙලාවෙ තමා අපි වැස්සට අහුවුණේ, ඉතින් අපි කැලේ මැද්දෙන් තිබ්බ අඩි පාර දිගේ දුවගෙන ඇවිත් ඇළ ඉවුර දිගේ දුවනකොට තමයි අත්තම්මගෙ ගේ දැක්කෙ'' තාරක කියාගෙන ගියා.

''ඔය බක්මීයායෙ, මේ ඇහැටුයායෙ, එතනින් ගිහාම නුගගහහේනේ, පලුගස්යායෙ... ඔය කොහෙත් උදවිය බේත් අවුසදයක් හොයාගන්න රිංගන්නෙ ඔය කැලේට තමයි පුතේ... මට මතකයි අපේ අප්පොච්චිලා ඉස්සර කැලේ ගිහාම මීවද, බමර වද හෙමත් කඩාන එනවා...''

"ඒක නෙමෙයි, අත්තම්මේ, දැන් නම් හොඳටම දවල්වෙලා... වැස්සත් පායලා... අපි එහෙනම් යන්නම්..."

"අපොයි ඔව් පැටවුනේ... දැන් ඔය දරුවන්නෙ අම්මලත් කලබල වෙලා ඇති ඔය දරුවො මොකද පරක්කු කියලා. හොඳයි එහෙනම් ගිහින් එන්න, නිවාඩු තියන වෙලාවක ආයෙත් මේ පැත්තේ එන්න දරුවනේ.."

පුංචි යාළුවො ටික නැගිටලා අත්තම්මට දණගහලා වැන්දා. අත්තම්මා හැමෝගෙම ඔළුව අතගාලා "රත්නත්තරේ පිහිටයි පැටවුනේ" කීවා. යාළුවො ටික යන්න සැරසුණත්, අත්තම්මව දාලා යන්න බැරි මොකක්දෝ දුකක් හිතට දැනෙන බව හැමෝටම තේරුණා. "අත්තම්මෙ, අපිට දැන් ඉස්කෝලෙ නිවාඩුනේ. අපි අම්මලගෙනුත් අහල අත්තම්මව බලල යන්න එන්නම්" තිපුනි කිව්වෙ හැමෝගෙම හිත් තේරුම් ගත්තා වගේ.

"අනේ මගෙ පැටියෝ, ඒක කොච්චර දෙයක්ද? හැබැයි රත්තරනේ, අම්මලට කියල එන්න ඕන හොඳද? ඒක නෙමේ පුතේ ඔය ඇළ ඉවුර දිගේම ගියාම බක්මීයාගෙ කඩමණ්ඩියට තමයි වැටෙන්නෙ. මේ හරිය මෙහෙම තිබුණට තව ටිකක් යනකොට පාර හොඳට හදල තියනවා."

"හොඳයි අත්තම්මෙ" කියපු පුංචි යාළුවො පිලෙන් එළියට බැහැලා මිදුල දිගේ ඒදණ්ඩ ළඟට ආවා. හැමෝම කතාවෙලා හිටියාවගේ ආපහු හැරිලා බැලුවා. අත්තම්මා හිනාවෙවී පිල උඩ ඉඳගෙන තමන් යන දිහා බලා ඉන්නවා ඔවුන්ට පෙනුණා.



Scanned by CamScanner

# 05

## සැනසුම් සුසුම්

සැහෙන වෙලාවක් ඇළ ඉවුර දිගේ ඇවිදගෙන ආපු යාළුවො දන්නෙම නැතිව කඩමණ්ඩියට ඇවිත්. පිංළිදට යන පාර ළඟ ඇටඹ ගහ ළඟදි කට්ටියම දැක්කා හැමෝගෙම අම්මලා පාරේ ඉදිරියට එනවා.

''අනෙ අප්පේ... දැනුයි ඇඟට ලේ ටිකක් ඉනුවේ... කොහෙද දරුවනේ මෙච්චර වෙලා ගියේ_ වැස්ස පායලත් දැන් කොච්චර නම් වෙලාද?'' ඒ තාරකගෙ අම්මා. ''අපි මේ පන්සල පැත්තට යන්න කියලා බැලුවේ... දහම් පාසල් ගිය අනිත් ළමයි හැමෝම ගෙවල්වලට ඇවිත් දැන් කොච්චර වෙලාද? අප්පච්චිලත් කුඹුරෙ.. යවන්න කෙනෙකුත් නෑ... අපි බයවුණු තරමක්...'' සනුලිගේ අම්මත් කියාගෙන ගියා.

''හරි හරි අම්මේ... දැන් අපි ආවනේ... ඉන්නකෝ මං විස්තරේ කියන්න'' තාරක සිද්ධිය අකුරක් නෑර කියන්න වුණා. විස්තරේ අහපු අම්මලා සැනසුම් සුසුම් හෙලුවා. ''කැලේදි සතෙක් සරුපයෙක්වත් කෑවනම් මොන දෙයියන්ට කියන්නද? ආයෙහෙම රිංගලා අහුවෙන්නෑ ඔය කැලේට... අපි මෙහේ ගිනි පත්තුවෙලා හිටියේ'' ඒ මලිත්ගෙ අම්මා.



Scanned by CamScanner

''ඒක තෙමේ අක්කෙ, කවුද ඔය මේගොල්ලො කියන අත්තම්මා? මම නම් එහෙම කෙනෙක් ගැන අහලවත් නෑ''

''ඒක තමයි නංගි, බාගදා අපේ අම්මලා අප්පච්චිලා දන්නවා ඇති. කෝක වෙතත්, දවසක අපිත් ගිහින් ඒ නැන්දට කතා කරලා එන්න ඕන... මේ දරුවො කාගෙද කින්ද මන්ද බලන්නෙ නැතිව මෙච්චර සත්කාර කොරාපු උන්දැ මොනතරම් හොඳ කෙනෙක්ද? අනෙක ඉන්නෙත් තනියමලුනේ...''

''ඒක තමයි අක්කෙ, අපි ළඟදිම දවසක ගිහින් එමු, කැවිලි මොනවත් හදාගෙන'' හැමෝම කතා වුණා.

''හොඳටම දවල් වෙලා. එහෙනම් දැන් යමු ගෙදර. දැන් මේ දරුවන්ට යකෙක් කන්න බඩගිනි ඇති.'' කියමින් නිපුනිගේ අම්මා ඉස්සර වුණා.



Scanned by CamScanner

# 06

## ඇළ ඉවුරේ රහස්

බක්මීයායට තවත් දවසක් උදා කරමින් හිරු පායා ආවා. හැම නිවාඩු කාලෙම වගේ ඇති තරම් සෙල්ලම් කරන්න, ගම පුරා කරක් ගහන්න මේ යාළුවන්ට දෙමාපියන්ගෙන් කිසිම තහංචියක් තිබුණෙ නෑ. ඒ හින්දා, උදේම බඩපුරා බත් කාපු යාළුවෝ ටික ඇටඹ ගහ යටට එකතු වුණා.

''අද අපි මොකක්ද කරන සෙල්ලම?'' මලිත් උඩ පනිමින් ඇහුවා.

''ම්.. ම්... මොකක්ද කරන සෙ...ල්...ල...ම...? මට නම් හැමදාම කරන සෙල්ලම් එපාවෙලා දැන්'' සනුලි තොල පෙරළමින් කිව්වා.

''හරි... මට ආව අදහසක්... අපි යං අත්තම්මලගෙ ගෙදර...'' ඒ තාරක.

''හරි... යං... යං... අපි යං'' සඳුන් උඩ පැන්නා. ''ඒත්... අම්මලාට කියන්නැතිව ගිහින්... අම්මලා අපිව හොයයිද? මතකනෙ ඊයෙ?'' නිපුනිට කියවුණා.



Scanned by CamScanner

''නෑ. අපි කොහොමත් තිවාඩු කාලෙට දවල් වෙනකම් සෙල්ලම් කරනවනේ. ඒ හින්ද අම්මල හොයන එකක් නෑ. අපි දවල් කෑම වෙලාවට ඉස්සර ගෙදර එමු.'' සඳුන් විසඳුමක් යෝජනා කළා.

''හා... එහෙනම් යමුකො... හැබැයි ඔන්න දවල් වෙන්න කලින් එන්න ඕන හරිද?'' නිපුනි බැරෑරුම් විදියට කිව්වෙ අනිත් අයට ගමනේ බරපතලකම මතක් කරන්නත් එක්කයි.

''ඒත්... පොඩි ප්‍රශ්නයක්.. අපි අත්තම්මට මොනවද ගෙනියන්නේ? සනුලි අමතක වුණු දෙයක් මතක් කළා.

''ඒක නම් ප්‍රශ්නයක් තමයි. ඒත් අපිට ගෙනියන්න දෙයක් නෑනේ. අත්තම්මලා අපි වගේ දං, ඇඹිල්ල වගේ ගෙඩි ජාති කන්නෙ නෑනේ. කමක් නෑ. ඊයෙ අම්මලා කිව්වා නේද කැවිලිත් හදාගෙන අත්තම්මව බලන්න යං කියලා. ඒ හින්දා අදට අපි මෙහෙම යං. අනික අත්තම්මත් දන්නවනේ අපිට දෙන්න දෙයක් නෑ කියලා'' සඳුන් කාගෙත් හිත් හැදුවා.

හැමෝම කඩමණ්ඩියෙන් ඇහැටුයාය පාරට හැරිලා ඇළ ඉවුරට ආවා. එක්කෙනා පිටිපස්සෙ එක්කෙනා ඇළ ඉවුර දිගේ ගියේ හරියට පෙරහැරක් වගේ. ඊයෙ වැස්ස නිසා ඇළේ වතුර තාම බොරම බොර පාටයි. ඇළ වෙනදාට වඩා වේගෙන් හෝ හෝ ගාමින් ගලනවා. ඒ වතුරෙ දිරාපු ලීකොට, පොල් ගෙඩි, කදුරු ගෙඩි පාවෙලා එනවා.



Scanned by CamScanner

සතුලිට පාසලේ පරිසරය පාඩමක් මතක් වුණා. ජලයේ ගිලෙන සහ පාවෙන දේවල් බලන්න කරපු ක්‍රියාකාරකම... වැස්ස දවසකට ඇළ ඉවුරට ආවා නම් පාවෙන දේවල් ගිලෙන දේවල් ලියන්න ටීචර් දුන්නු වගුව ඉක්මනටම පුරවගන්න පුළුවන් නේද කියලා එයාට හිතුණා.

එකපාරටම කොරවක්කෙක් කෙටලගාලක් අස්සෙ ඉඳලා 'කුවාක්, කුවාක්' කියලා කෑගහමින් කුඹුර පැත්තට දුවලා ගියා. 'ඔය කියන්නෙ කුරුටු පුවාක්, කුරුටු පුවාක් කියලා. එයා ගඟ මැදදි ඔරුවෙන් පෙරළුණු පුවක් ගෝනි ටික තාමත් හොයනවා." මලිත් කිව්වේ ආඩම්බරෙන් වගේ. "අනේ ඒ මොකද්ද? අපිටත් කියන්නකො ඒ කතාව." හැමෝම මලිත්ට පෙරැත්ත කළා. මලිත් එයාට, දවසක් කිරිඅම්මා කියලා දීපු කොරවක් හාමිගේ කතන්දරය යාළුවන්ට කියලා දුන්නා. ඔහොම ටික දුරක් යනකොට එයාලගෙ අඩි සද්දෙට බයවුණු කිරලෙක් හයියෙන් කෑ ගහමින් ඉහළින් වටේට ඉගිල්ලෙන්න වුණා. "සුවර් එකටම මේ කිරලා මේ හරියෙ බිත්තර දාලා ඇති. ඒකයි ඔය කෑගහන්නේ..." සඳුන් කීවේ පණ්ඩිතයෙක් වගේ. හැමෝටම බකස් ගාලා හිනා ගියා. "ඇයි මොකද හිනාවෙන්නේ?" එයාට ටිකක් විතර තරහා ගිහින් "ඇයි අනේ, කිරලා කොහොමද බිත්තර දාන්නෙ? කිරලිනේ බිත්තර දාන්නෙ" නිපුනි හිනාව අතරින් කිවුවා. "හරි... හරි ඉතින් මොකා වුණත් කමක් නෑ මං කිව්වෙ ඌ බිත්තර තියන නිසා බයවෙලා කියලයි." සඳුන් කීවේ මූණ පුළුටු කරගෙන. "ඒක



Scanned by CamScanner

හරි... ඇයි, තව මං අහලා තියනවා කිරලි බිත්තර රකින්නේ බිත්තර ටික පිටෙන් වහගෙන කකුල් දෙක උඩු අතට තියාගෙනලු.'' නිපුනි කිව්වේ එයාටත් දවසක් වෙලේදි කිරිඅත්තා කියා දුන්න දෙයක්.

''ඒ මොකද?'' මලින්ට ලොකු ප්‍රශ්නයක්. ''අහස කඩන් වැටිලා බිත්තර ටික කුඩු වෙයි කියලලු. අහස කඩන් වැටුණොත් කකුල් දෙකෙන් අල්ලලා නවත්තලා බිත්තර ටික බේරගන්න පුළුවන් කියලාලු'' නිපුනි උත්තර දුන්නා. ''හරිම මෝඩ කුරුල්ලෙක්'' සඳුන් කීවේ තාමත් තරහින් වගේ. ''හැබැයි ඔයා තරම් නෑ'' නිපුනි කීවේ තාරකව තව ටිකක් අවුස්සන්න හිතාගෙනයි. ''හැබැයි නිපුනි, ඔයා ඊටත් වඩා මෝඩයි'' තාරක හොඳටම තරහින් කිව්වා.

''හා... හා... දැන් ඕක නවත්තගන්න... අපි අත්තම්මගෙ ගේ ළඟටම ඇවිල්ලා. කට්ටියම ඒදණ්ඩෙන් ගිහින් වහලා තිබුණ කඩුල්ලේ උණ ලී අයින් කරලා වත්තට ඇතුළු වුණා.

''ආ... මෙ අපි ඊයෙ කාපු බැදි දෙල් හැදෙන ගහ නේද?'' මලින් ගහ දිහා බලාගෙනම කිව්වා. ''බැදි දෙල් නෙවේ... කැළෑ දෙල්. බැදි දෙල් කියන්නේ ඒ ඇට බැදපුවාමනේ.'' සනුලි කිව්වේ ඊයෙ ආත්තම්මා බැදි දෙල් ගැන කියපු විස්තරේ මතක් කරගන්න ගමන්.

''අර බලන්න... ඒ ගහේ කොළවල හැටි... හරිම ලස්සනයි. හරියට කවුරු හරි රැළි තියලා වගේ'' තාරක පෙන්නුවා. 'ආනේ... ඔව්මයි.''



Scanned by CamScanner

එකපාරටම කට්ටිය උඩගිහින් බිම වැටුණේ කලු මහත්තයාගේ බිරිල්ලට. යාළුවො ළඟට කඩාගෙන බිඳගෙන දුවගෙන ආවත් ටික වෙලාවකින් බිරිල්ල අඩුවෙලා ගිහින් වලිගය වනන්න ගත්තා. ඒ සද්දෙට අත්තම්මා පිලේ ඉඳලා මිදුලට බැස්සා.

''අනෙ අප්පේ... මේ පැටවුනේ... කොච්චර හොඳද ආපු එක... එන්න දරුවනේ... ආ... කලුවො බුරාගන ගියාට මොකද උඹ දැන් මේ දරුවො එක්ක යාළුවෙලා නේද? බොහොම හොඳයි''

යාළුවො ටික අත්තම්මා පස්සෙන් ගිහින් පිල උඩ ඉඳගත්තා. ''මේ දරුවො උදේට කාලයි ඉන්නෙ?''

''ඔව් අත්තම්මෙ, අපි බඩපිරෙන්න බත් කාලයි ආවේ''

''ආ.. එහෙමද පුතේ. මං නම් උදේ එළකිරි ටිකක් බීපු ගමන් ඉන්නේ.''

''අත්තම්මට එළකිරි කොහෙන්ද?''

''ආන් පුතේ... අර ඉන්නෙ මඩුවෙ අපෙ රත්ති. එයාගෙන් තමයි.''

''අත්තම්මද කිරි දොවන්නේ?''

''අනේ නෑ පුතේ, ඉස්සර නම් මං තමයි කිරි දෙව්වේ. දැන් නම් මට ඒ වගේ වැඩ ටිකක් අමාරුයි. පහළ ගෙදර සිරිමල් පුතා තමයි උදෙන්ම ඇවිත් කිරි ටික දොවලා දෙන්නේ. හඳයාටත් ඉතුරු කරලා දොවාගන්නේ කිරි ටිකයි පුතේ. ඒකෙන් මං ටිකක්

Scanned by CamScanner

අරගෙන ඉතුරු ටික සිරිමල් පුතාට ගෙනියන්න දෙනවා. අනේ ඒ දරුවො තමයි මට හැමදේටම උදව් කරන්නේ. මගේ ලියදි දෙකතුන වැඩකරල දෙන්නෙ, ඉරිදා පොළෙන් අඩුවැඩිය ටික ගෙනත් දෙන්නෙ, ලෙඩක් දුකක් හැදිච්ච වෙලාවට කෑම ටික හදලා ගේන්නෙ, බේත් ටිකක් ගන්න එක්ක යන්නෙ ඔය සිරිමල් දරුවා තමයි. ඒ දුවත් නිතර දුවගෙන ඇවිත් මං කෑවද බිව්වද කියලා හොයලා බලනවා. අනේ ඒ දරුවන්ට පින්සිද්ද වෙනවා මං වෙනුවෙන් මෙච්චර මහන්සි වෙනවාට''



Scanned by CamScanner

# 07

# කුරහන් තලප

"ඒක නෙමේ පුතේ, මං මේ හීලට ගන්න කුරහන් තලප ටිකක් හැදිගාන්න සූජානම් වුණේ... එහෙනම් මං පුතාලටත් එක්ක තලප ටිකක් හැදිගාන්නම්"

"අත්තම්මේ, අපේ කිරි අම්මලා කුරහන් තලප ගැන කියලා තියෙනවා මට මතකයි. හැබැයි අපි කාලා නෑ" තිපුනි කීවා.

"ඔව් පුතේ, දැන් ඔය වගේ කෑම ගෙවල්වල හැදෙන්නෙ නෑනේ... අද කාල බලමුකෝ..."

"අපිත් අත්තම්මට උදව් කරන්නම්" හැමෝම කිව්වා "එහෙනං යං පුතේ කුස්සියට..."

අත්තම්මා පස්සෙන් වැටුණු යාළුවො ටික කුස්සියට ආවා. අත්තම්මගෙ කුස්සිය පුංචි වුණත් හරිම පිරිසිදුයි. පිළිවෙලයි. ලිග්ගල් තුනේ ලිප් දෙකක් තිබුණේ කුස්සියේ එක බිත්තියක් අයිනේ බිමයි. ගොම මැටි ගාලා තිබුණ ලිප් දෙකට ඉහළින් දුම්මැස්ස. වතුර කළගෙඩිය තිබුණේ කුස්සියේ කෙළවරක පැතිලියට වළක් වගේ හිටින්න හදපු තැනක. එතන, කළගෙ ඩිය හෙළවෙන්නෙ පෙරළෙන්නෙ නැතිව අපූරුවට තිබුණා.



Scanned by CamScanner

කොළොම්බු කොටයක් ඇදලා ගත්ත අත්තම්මා යාළුවන්ට ඉඳගන්න පුංචි පැදුරක් දුන්නා. අත්තම්මා කොළොම්බු කොටයෙ වාඩිවෙලා ලොකු මැටි හට්ටියකට වතුර පුරවලා ඒක ලිපෙන් තියලා ලිප පත්තු කළා. වතුර ටික රත්වෙන අතරේ, ලිපට ගින්දර ළං කරන අතරෙ මෙහෙම කිව්වා.

"ඕං පුතේ බලාගන්න... ඉස්සරවෙලාම වතුර ටිකක් උතුරවා ගන්න ඕන. ඒකට ලුණු ටිකක් යහමින් දාන්න ඕන. වතුර නටනකොට කුරහන් පිටි දාලා මේං මෙහෙම හැඳිගාන්න ඕන. හැන්දෙන් නම් මේක කොරන්න අමාරුයි. ඒකට තමයි මේ පත්ත තියෙන්නේ" අත්තම්මා කියන ගමන් පත්තෙන් කුරහන් තලපය හැඳිගාලා ටිකක් ඇඟිල්ලට අරගෙන දිවේ ගාලා බැලුවා. ඊට පස්සෙ හට්ටිය ලිපෙන් බෑවා. මැටිකෝප්පෙ වතුරෙන් තෙමලා ඒකට තලප හැන්දක් බෙදලා මැටිකෝප්පෙ කීපවතාවක්ම කැරකෙව්වා. එතකොට දුම්දමන තලප ගුලිය මැටිකෝප්පෙ ඇතුළෙ පෙරළි පෙරළි ලස්සනට බෝලයක් වගේ හැදුණා.

"ඇයි අත්තම්මෙ එහෙම මැටිකෝප්පෙ කරකවන්නෙ?" යාළුවො හැමෝටම හරිම ප්‍රශ්නයක්. අත්තම්මා හිනාවෙවී මෙහෙම කිව්වා. "පුතේ, මේ තලප තාම හරි උණුයිනේ... ඉතින් අතින් අල්ලන්න බෑ. හැබැයි තිවුණොත් හයිවෙනවා. ඒ හින්දා අත පුච්චගන්නෙ නැතිව ගුලිකරගන්න තමයි මෙහෙම කරන්නේ" මේ විදියට අත්තම්මා ඉතිරි තලප ටිකත් ගුලි කළා.

"දැන් තලප කන්නෙ මොනව එක්කද? තාරකට



Scanned by CamScanner

ඉවසිල්ලක් නෑ. ''ආ... ඒක නේන්නම් පුතේ... කෝ... මට හාංකවිසියක් මතක් වුණේම නෑනේ... පුතාලට කියන්න පුතේ.. අපි තලප හදන්න ඉස්සර තලප කන්න වෑංජනයක් හදාගන්න ඕනේ. නැත්නම් වෑංජනේ හදනකොට තලප ටික නිවිලා හයිවෙන්න බලනවා. උණු උණුවෙ තලප කන්න නම් වෑංජනයක් කලින්ම හදල තියාගන්න ඕනෑ. ඉතින්, මං අල කොළ ඇඹුලක් කලින්ම හදලා තිබුණේ. හැබැයි පුතාල එන්න කලින් හැදූව හින්දා ගොඩක් නම් නෑ. කාරි නෑ තියන හැටියකට බෙදාගෙන කමු.''

''මොන අලවල කොළද අත්තම්මෙ ඒ?'' මලිත් ඇහුවා. 'අනේ පුතේ, ඒව අල ජාතියක් නෙමේ... මය වෙල්වල. ඇළ ඉවුරුවල නියරවල් අයිනෙ එහෙම හැදෙන හබරල වගේ ජාතියක් පුතේ... පුතාල දැකල ඇති මයෙ හිතේ...''

''ඉතින් අත්තම්මේ අපේ අම්මලා ඒව අල්ලන්නවත් දෙන්නෙ නෑනෙ අත කසනවා කියලා. එහෙව් එකේ, කනකොට කට කසන්නැද්ද?'' මලිත් ඇසුවේ පුදුමෙන් වගේ.

''ආ.. පුතේ, ඒවා උයන විදියක් තියනවා. දිග ඇරිච්ච නැති දලු තමයි කඩාගන්න ඕන. ඊට පස්සෙ ඒව වට්ටියක දාල දවසක් විතර මැළවෙන්න තියන්න ඕනෑ. පස්සේ සෝදලා තරමක කෑලිවලට කඩාගන තෙල් ටිකක් ලිපේ තියලා රතුළූෑණු, අමුමිරිස්, සුදුළූෑණු, අබ වගේ පහේ ටිකයි කඩාගත්ත මිරිස් කරල් ටිකක් හෙමයි දාලා ටිකක් බැදෙන්න අරිනවා.

ඊට පස්සෙ අලකොළ කැලි දාලා පදමට ලුණු, කහ, ගොරකා කෑල්ලක් හෙම දාලා වතුර ඩිංගක් දාලා හින්දගන්නවා. ඕක එක්ක තලප මරන්න පුළුවන් දරුවනේ...''

වැහුං ඇරපු හට්ටියෙන් ආපු අල කොළ ඇඹුලේ සුවඳට යාළුවො කට්ටියගෙම කටට කෙළ ඉනුවා. ''පුතේ ඉස්සර නම් අපි කුරහන් තලප විතරක් නෙමේ, ඉරිඟු තලපත් හදනවා. තලප කන්න කොල්ලු ආනම, මුංඇට ආනම, තිබ්බටු ආනම වගේ වෑංජන් තමයි හදන්නේ''

''ආනම... අත්තම්මෙ, මං හිතාන හිටියෙ ආනම කියන්නෙ හැඳි එල්ලන එකට කියලා'' සඳුන්ට ලොකු ප්‍රශ්නයක්. ''අපෙ අප්පේ... පුතේ.. හිටින්ට මං කියලා දෙන්න. ඒ පුතේ හැඳි ආන... මේ ආනම... ආනම කියන්නේ හොඳට බොරේ හිටින්ට උකුවට හදාගත්තු වෑංජනයක්. එහෙම තමයි. මේ දරුවො නොදන්න දේවල් වැඩිහිටියන්ගෙන් අහලා දැනගන්න එපැයි... නේද පුතේ...''

08

# ඇබැද්දියක්

කතාවෙන් කතාවෙන් අත්තම්මා බෙලෙක් පිඟන්වලට තලපයි අලකොළ ඇඹුලයි බෙදලත් ඉවරයි. තාමත් තලප ගුලි වලින් දුම් දානවා. සඳුන්ට නම් ඉවසගෙන ඉන්න බැරි හැඩයි. එයා තලප ගුලියක් අතට අරන් කෑල්ලක් කටින් කඩලා කන්න ගත්තා.

''ඈ...යි... අත්තම්මෙ මේ තලප මගෙ දත්වල ඇලෙනවනේ...'' සඳුන් කෑගැහුවා. ''අනේ රත්තරනේ, මට කියන්න අමතක වුණානේ... තලප හපලා කන්න බෑ... මේං මෙහෙම පුංචි පුංචි ගුලි කඩාගෙන ඇඹුලෙ ඔබලා හපන්නැතුව ගිලින්න ඕනෑ. හැපුවොත් කටේ ඇලෙනවා. හිටින්ට පුතේ මං උණුවතුර ඩිංගක් ගේන්ට...''

අනිත් යාළුවො හොඳටම හිනාවෙනවා වෙච්ච ඇබැද්දිය මදිවට යාළුවොත් හිනාවෙනකොට සඳුන්ට හොඳටම තරහ ගියා. ''ආ... එනව දැන් ලොක්කො වගේ හිනාවෙන්න.. මං නිසා තමයි මේගොල්ලොත් තලප කටේ අලවගන්නැතිව බේරුණේ... මොකද



Scanned by CamScanner

ඔයාල දන්නෙත් නැනේ තලප කන හැටි.. නැද්ද අත්තම්මේ?'' සඳුන්ගේ මූණ තරහින් රතුවෙලා.

''හා... හා පුතේ, දැන් ඔය ඇති... ඒ දරුවට හිනාවෙන්න එපා. හැබැවනේ.. ඒ පුතා හින්දනේ ඔය දරුවොත් තලප කන හැටි ඉගෙන ගත්තේ. අනේ පුතේ... තව ඩිංගෙන් මට අමතක වෙනවා.... කලුමහත්තයයි සේනියයි තලප කන්නෑනේ, ඊයෙ රෑ ඉතුරු වෙච්ච බතුයි කරෝල හින්දපුවයි තියනවා. මං ඒ ටික අනල ඒ දෙන්නට දීල එන්නම්. පුතාල කන්න එතකල්, බලන්නකො තලපයි අලකොළ ඇඹුලයි රසද කියලා''

''ම්... හරිම රසයි'' කලුමහත්තයටයි සේනියාටයි බත් දීලා ආපු අත්තම්මට ඇහුණා. ''මං නම් කවදාවත් කාපු නැති රසක්'' සතුලි කියනකොට අනිත් අය ඔලුව වනලා සතුලිට එකඟ වුණා. හැමෝම රස කරමින් කුරහන් තලපයි අලකොළ ඇඹුලයි කෑවා.

''අත්තම්මාට කුරක්කන් කොහෙන්ද? පොළෙන් ගේනවද?''

''අනේ නෑ පුතේ, ඔය පිළිකන්න පැත්තෙ ඇළ ගාවට වෙන්න මට කුරහන් සේරු බාගයක් විතර ඉහලා තිබුණා. පසුගිය දොහක කරල් කපලා වේලලා සිරිමල් පුතා අත මෝලට ඇරියා. මං ඔය ඉඳහිට තලපයක්, රොටියක්, පිට්ටුවක් තම්බගන්න ටිකක් තියාගෙන ටිකක් කොළඹ පුතාලට ඇරියා. තව ටිකක් සිරිමල් පුතාට දුන්නා.''

''පුතේ අපි කහට ඩිංගක් බීලා ඉමු, තලපවල බර ගතිය යන්නත් එක්ක'' අත්තම්මා කේතලය ළිප

තබමින් කීවා. ටිකකින් තේ වක්කරපු අත්තම්මා බෙලෙක් කෝප්පවලට දාලා දරුවෝ අතට දුන්නා. හැමෝටම පුංචි හකුරු කෑල්ලකුත් ලැබුණා. කට්ටියම සතුටින් තේ බිව්වා.

"අපි ටිකක් වත්තට ගිහින් සෙල්ලම් කරමුද?" නිපුනි ඇහුවා. "ඒක හොඳ අදහස..." හැමෝම මිදුලට ගියා. ම්... කැළෑ දෙල් ගහයට නම් සෙල්ලම් කරන්න කියාපු තැන. හොඳට හෙවණත් තියනවා..."

"මේ... මේ මොකද්ද? ඉඳගෙන ඉන්න හදාපු බංකුවක්ද?" "ආනේ ඔව්මයි... හැබැයි මේක නම් බංකුවක් නෙමෙයි. මේ දිග ලීයකුත් තියෙන්නේ... ඒක හරියට මේක වටේ කරකවන්න වගේ හදලා තියෙන්නේ" යාළුවෝ වටවෙලා එක එක අදහස් පළ කළා.

මේක අහන් හිටපු අත්තම්මා හිනාවෙවී එතනට ආවා. "ඇයි පැටවුනේ මීට කලින් දැකලා නැද්ද? මේ තමයි සෙක්කුව, ඉස්සර අපි මී තෙල්, පොල් තෙල් හිඳින්නේ මේ සෙක්කුවේ දාලා තමයි. ඔය මැද කුර ගාවින් කොප්පරා හරි මී ඇට හරි මල්ලක් දාලා උඩින් තද කරලා ඔය ලීය දානවා. ලීයෙ අග හරකෙක් බඳිනවා. ඉතින් ඌ ලීයත් ඇදගෙන වටේ යනකොට මී ඇට හරි, කොප්පරා හරි කැලිවලට කැඩිලා කුඩුවෙලා ආං අර බටේ දිගේ තෙල් වැක්කෙරෙනවා. ඒක යටින් කල්දේරමක් හරි බූලියක් හරි තියලා තෙල් ටික එකතු කරගන්නවා."

"එතකොට අත්තම්මෙ, අර වී බිස්ස දැන් පාවිච්චි කරන්නෙ නැද්ද?" තාරක ඇහුවේ වී බිස්සට අත



Scanned by CamScanner

දික්කරමින්. ''අනේ නෑ පුතේ, දැන් බිස්සක දාන්න තරම් වී එකතු වෙන්නෙ නැනේ. අනික මේ තනිමට මොකටෙයි බිස්සක දාන්න තරම් වී ගොඩක්? නේද පුතේ?''

''අත්තම්මෙ, මේ දෙල් ගහ යට නම් සෙල්ලම් ගෙයක් දාන්න තියමයි'' සතුලි ආසාවෙන් කිවුවා.
''ඉතින් පුතේ, දාන එකනෙ ඇත්තෙ''

''ඒත් අත්තම්මෙ, අද අපි ආවෙ අම්මලට කියන්නෙ නැතුවනේ. අපි ආවෙ සෙල්ලම් කරන්න එකතුවුණු ගමන්. ඒ හින්ද අපි ඉක්මනට යන්න ඕනෙ. අපි සෙල්ලම් කරන්නත් එක්ක වෙනින් දවසක එන්නම් අත්තම්මෙ...''

හැමෝම අත්තම්මට වැන්දා. ''අනේ රත්තරනෙ, පරෙස්සමෙන් ගෙවල්වලට යන්න. මේ දරුවන්ට රත්නත්තරේ පිහිටයි අම්මලාට කියලා එන්න එපායැ පුතේ... ඒ දරුවො බය වෙනවනේ...''

යාළුවො ටිකට අත්තම්මව දාලා යන්නත් දුකයි. ඒත් කීයට හරි යන්න ගෙදර යන්න එපායැ.



Scanned by CamScanner

# 09

## නෑ ගමනක්

"පුතේ, තාරක... ඔය වැලිතලප ටික පෙට්ටියකට අහුරන්නකෝ... මං මේ නංගියව ලෑස්ති කරන් එනකම්... ආ පෙරේදා අප්පච්චි කපපු සීනි කෙහෙල් කැනෙන් හොඳ ඇවරියක් කපලා මේසෙ උඩ තිබුණා. අනේ පුතේ ඒකත් දාගන්න..."

"හා අම්මේ.. මං මේ වැලිතලප අහුරන ගමන් ඉන්නේ..."

"අනේ පුතේ, මටත් ඩිංගිරි අක්කලෑ ගෙදර යන්න නං ආසයි. කාලෙකින් සිල් සමාදන් වෙන්න ආවෙත් නැති නිසා දකින්නත් ආසයි. ටික දොහකින් දැක්කෙත් නෑනේ... ඒත් පුතේ, ඇළ ඉවුරෙ වැස්සට මඩ වෙලත් ඇති නේද? එහෙම තියෙද්දි මට යන්න ඇහැකියැ?"

"ඔව් කිරි අම්මෙ... කිරි අම්මට නම් දැන් යන්න අමාරුයි. ඒ හින්දා අපි වෙන දවසක යං නේද කිරි අම්මෙ? මං කියන්නම් අපේ කිරි අම්මා අත්තම්මව මතක් කළා කියලා.

"හොඳයි පුතේ, එහෙනම් පරිස්සමින් ගිහින්



Scanned by CamScanner

එන්න පුතේ...'' තාරකයි, අම්මයි, නංගියි ඇටඹ ගහ යටට එනකොට සඳුනුයි මල්ලියි, නිපුනියි නංගියි අම්මලත් එක්ක කලින්ම ඇවිත් හිටියා. කට්ටියම මග බලන් හිටියේ මලිත්ලයි සතුලිලයි එනකම්. ඔන්න වෙලේ අනිත් පැත්තෙන් සතුලියි අක්කයි අම්මයි, මලිතුයි අම්මයි එනවා පේනවා. හැමෝම බරටම කදමලු අරගෙන අද මේ කොහෙද යන්නෙ? වෙන කොහෙවත් නෙමේ... අත්තම්මා බලන්න... පුංචි පැටවුන්ගෙ සතුට දෝරෙ ගලනවා ඇළේ වතුරටත් වඩා...

විහිළු කරමින්, හිනාවෙමින් කට්ටිය දන්නෙම නැතුව ඒදණ්ඩ ළඟටත් ඇවිල්ලා. බරටම උස්සාගෙන ආපු මලු පෙට්ටි අතට ගත්ත යාළුවො ටික මුලින්ම එගොඩ වුණා. ඒ අම්මලාට පුංචි නංගිලා, මල්ලිලාව වඩාගන ඒවත් උස්සගෙන ඒදණ්ඩෙ යන්න බැරි නිසා.

අත්තම්මා පිලේ ඉඳගෙන පැදුරක මෝව්ට පුරනවා. කතාබහක සද්දයක් ඇහිලයි අත්තම්මා කඩුල්ල පැත්ත බැලුවේ ''අනෙ අප්පේ, මයෙ පැටව් ටික අද අම්මලත් එක්ක ඇවිල්ලනේ... අනේ කොච්චර එකක්ද? එමු... එමු... දුවේ.. අප්පේ... මේ මොනවද බරටම උස්සාන... මොකටද දරුවනේ මෙච්චර මේ මලු, පෙට්ටි... හා...හා... දුවේ ඔය තියන හැටියට ඇඳිගමු...'' කියමින් අත්තම්මා අලුත් පැදුරු දෙකක් ගෙනැවිත් පිලේ එලුවා.

අම්මලා ගෙනාපු මලු, පෙට්ටි පිලේ පැත්තකින් තියලා හැමෝම පිල උඩ වාඩිවුණා.



Scanned by CamScanner

"ඉතින් නැන්දෙ, එදා වැස්සට අහුවුණු දවසෙ ඉඳන්ම මේ දඟයො ටික කියවන්නෙම නැන්දා ගැන තමයි. නේද අක්කේ?" නිපුනිගේ අම්මා අතිත් අම්මලා දිහා බලමින් කිවුවා.

අත්තම්මගේ මූණෙ හිනාමලක් පිපුණා. "අනේ දුවේ මටත් එහෙමයි. දවසක් දෙකක් එකදිගට මේ දරුවො දැක්කෙ නැත්නම් හරි සාංකාවයි. ඒත් මං මේ පැටවුන්ට තිස්සෙම කියන්නේ එනව නම් අම්මලාට කියල එන්න කියලයි.

"ආ... ඔව් නැන්දෙ... එදා හොරෙන් කැලේ පැන්නට දැන් නම් එන්නෙ අපිට කියලා තමයි. ඒක නෙමේ නැන්දෙ... එදා නැන්දා මේ දරුවන්ට කරලා තිබුණෙ සුළුපටු සත්කාරයක් නෙමේ... අනේ මේ නැන්දට පින්සිද්ද වෙන්නෝන..."

"අප්පේ... දුවේ, ඕක පින්දෙන්නත් දෙයක්ද? මේ දරුවො මහවැස්සෙ ගෙට ගොඩවුණාම දරුවො ටික ටිකක් පිහදාලා සීතලට කෝපි ඩිංගක් හදල දුන්නා එච්චරයි..."

"ඒ වුණාට.. මේගොල්ලො මෙහෙට දුවගෙන ආවෙ වාසනාවකට වගේ... නැත්නම් තෙමි තෙමී ගෙදර දුවගෙන ආවනම් ඉස්පිරිතාලෙන් මෙහා නවතිනවා බොරු."

"ඇයි නැන්දෙ, දැන් මේගොල්ලො කන්න ගියාම කියන්නෙම නැන්දගෙ කෑමවල රස ගුණ ගැන. අපිට කියනවා කුරහන් තලප හදන්නලු. අල කොළ ඇඹුල හදන්නලු."



Scanned by CamScanner

"මගෙ පැටවුනේ, අත්තම්මගෙ කෑම එච්චරටම රහවැටිලද? අනේ දුවේ ඕක මොකක්ද? මං කියල දෙන්නංකො ඔය හැමදේම හදන හැටි."

"අම්මෝ නැන්දෙ... ඒ රාජකාරියත් එයාලම කරනවා අපූරුවට... අපරාදෙ කියන්න බෑ.. වෙනදා බත් පිඟාන බලාන කුස්සියට එන අය දැන් කුස්සියෙ ඉඳගෙන අපිට උයන්න උපදෙස් දෙනවා... ඒ විතරක් නෙමෙයි උදව් පදවුත් කරනවා..."

"අනෙ අප්පේ... අපේ දඟයො ටික හරි හපන්නු නොවැ... ඔහොම ඉන්ටකො පුතේ... කතා කොර කොර හිටියා මිසක් මේ දරුවන්ට කහට ඩිංගක්වත් දෙන්න බැරිවුණා. මං විගහනියට අග්ගලා ඩිංගක් ගුලිකරාගෙන එන්නං..."

"අනේ... දැන් මොකවත් හදන්න එපා නැන්දෙ... අපි නැන්දට කැවිලිත් හදාගෙනමයි ආවෙ..." කියමින් තාරකගෙ අම්මා පිලෙන් නැගිට්ටා. අනිත් අම්මලා ටිකත්, මලුයි පෙට්ටිය උස්සගෙන ගේ ඇතුළට ගියා අත්තම්මත් එක්ක.

ඒ අතරේ යාළුවො ටික නංගිලයි මල්ලිලයි අක්කයි එක්ක දෙල්ගහ යට සෙල්ලම් ගෙයක් දාන්නයි ලෑස්තිය. ඒ මදිවට තවත් යාළුවො දෙන්නෙක්... කලුමහත්තයයි සේනියයි...

"පැටවුනේ, ඇවිත් තේ බීලා ඉන්න..." අත්තම්මා පිල උඩ ඉඳන් කතා කළා.

දුවගෙන ආපු යාළුවො ටික අත්තම්මාගෙ පුංචි මේසෙ කැවිලි වලින් පිරිලා තියන හැටි දැක්කා.



Scanned by CamScanner

''අම්මෝ... අත්තම්මගෙ ගෙදර අද මගුල් ගෙයක් වගේ...'' තිපුනි උඩපැන්නා. ''හැබැයි පුතේ මගුල් ගෙදරට කැවිලි හැදුවෙ නම් මම නෙමෙයි මං...'' අත්තම්මා හිනාවුණා.

''ආ.. පැණි වළලු හැදුවේ අපේ කිරිඅම්මා'' මලින් කිව්වා. ''ඇයි... වැලිතලප හැදුවෙ අපෙ අම්මයි කිරිඅම්මයි එකතුවෙලා'' තාරකත් දෙවෙනි වෙන්න කැමති නෑ. ''ආ... එතකොට තල අලුවා හැදුවේ අපෙ අම්මයි පහළ කිරිඅම්මයි...'' ඒ සතුලි ''ඇයි... අපේ අම්මයි නැන්දයි තමයි කී රොටි හැදුවෙ...'' තිපුනිත් තරගෙට වගේ කිව්වා. ''හැමෝම කැවිලි හදන හින්දා අපේ අප්පච්චි ඇඹුං ඇවරි කපලා දුන්නා අරන් එන්න...'' ඒ මලිත්.

''ඒක තමයි මයෙ රත්තරනේ.. පුතාලටයි, අම්මෙ අප්පච්චිලාටයි. කිරි අම්මලාටයි හුඟාක් පින් මං වෙනුවෙන් මෙයාකාර මහන්සි වුණාට... ගන්න පුතේ.. අරන් කන්න..'' අත්තම්මා හරිම සතුටින් කිව්වා.

''ඉස්සෙල්ලාම අත්තම්මා කන්නකෝ'' ''හා හොඳයි පුතේ... කට්ටියම කමු''

''නැන්දම්මේ... නැන්දම්මේ...'' කවුදෝ කතාකරනවා ''ආ... මේ සිරිමල් පුතානෙ...'' ''ආ... නැන්දම්මෙ මං මේ කුඹුර පැත්තෙ යන ගමන්... කුඹුරට වතුර හරවලා ඉවර වෙලා පෝර ටික ගෙන්න හන්දිය පැත්තෙ යන්න කියලා... ඒක නෙමේ නැන්දම්මෙ.. අද පොඩි යාළුවො ටික ආවද? මං දැක්ක දැන් ටිකකට කලින් දෙල් ගහ යට ඉන්නවා.''

''ආ ඔව් පුතේ... ඒක නෙමේ.. වෙලට යන්න ඉස්සර

තේ ටිකක් බීලා යමු...'' ''අනේ බෑ නැන්දම්මෙ, මං මෙ බඩ පුරා හීල්බත් කාපු ගමන්. ''අපෙ අප්පෝ.. ඒකට මොකද? හීල් බත් කෑවා කියලා තේ ඩිංගක් බොන්න බැරුවයි... එමු එමු ඇතුළටම...''

ගේ ඇතුළට ගිය සිරිමල් මාමා දැක්ක දෙයින් පුදුම වුණා.

''මෙ කවුද නැන්දම්මෙ මේ... මෙච්චර කට්ටියක් ඉන්න බව මං දන්නෑනේ...''

''ආ... මෙ සිරිමල් අයියනේ... අයියගෙ ගෙවලුත් මෙ හරියෙද?'' සනුලිගේ අම්මා ඇහුවා.

''ඔව් නංගි.. නැන්දම්මලාට පිටිපස්සෙ තියෙන්නෙ අපේ වත්ත''

''ආ දුවේ දුවල සිරිමල් පුතාව අඳුනනවද'' අත්තම්ම ඇහුවෙත් පුදුමෙන් වගේ.

''ඇයි නැන්දෙ ඉස්සර මේ අයියලා එනව ඇහැටුයායෙ කාණ්ඩෙත් එක්ක අපේ ගොයම් කපන්න... මේ අපේ පුංචි අයියලගෙ යාළුවෝ''

''ඒකනෙ නංගි.. දැන් මේ සුනාමියි, භූතයොයි හින්ද එහෙම කාලයක් ආයෙ එන්නෙ නෑ. දැන් ගොයම් කවියක්, නෙළුම් කවියක් අහන්නවත් ලැබෙන්නෙ නෑ. අපේ දරුවන්ට ආසාවටවත් බලන්න අත්තමක්, කයියක් දැන් දකින්නවත් නෑ.''

''ඒක ඇත්ත අයියෙ...''

''ඉතින් නංගි, අයියලා සමන් මල්ලිලා හෙම හොඳින් ඉන්නවාද?''



Scanned by CamScanner

"ඔව අයියෙ මෙලහටත් කුඹුරෙ ඇති... හොඳට වැස්ස නිසා අද බක්මීයාමෙ යායම හාන්න අරන්..."

"මෙහෙ නං දැන් ඉහලත් ඉවරයි නංගි, මාත් මේ වතුර හරවලා එන්න යන ගමන්..."

"ගන්නකො අයියෙ තව මොනවහරි..." "අනේ අප්පේ... තව නං මුකුත්ම කන්න බෑ. රහ හින්දම සෑහෙන්න කැවුණා. අද දවල්ට බත් කාලත් හමාරයි" කියමින් සිරිමල් මාමා නැගිට්ටේ තේ කෝප්පය හිස් කරලා මේසෙ උඩින් තියලායි.

"කැවිලි ටික නං පංකාදුයි නංගි. යහමින් අත්ගුණේ කියනවා මේ නංගිලාට... තේද නැන්දම්මේ"

"ආ... අයියෙ, මේ කැවිලි ටික අක්කටයි දූටයි දෙන්න..." අනේ නංගි නැන්දම්මට ගෙනා කැවිලි මට දීල හරියනවැයි?

"අපොයි අයියෙ... අපි ගොඩක් හදාන ආවා. ඒන නම් නැන්දට තව කාට හරිත් දෙතැකි."

"බොහෝම ස්තුතියි නංගියේ, එහෙනම් මං ගිහින් එන්නම්. නැන්දම්මෙ මං යනෝ..."

යාළුවො ටිකත් තේ බීලා දෙල්ගහ යට සෙල්ලම් ගෙදරට දිව්වා. අද කලුමහත්තයටයි, සේනියටයි හරි වාසියි. ඇයි යාළුවො කන කන කැවිල්ලකින්ම කෑල්ල කෑල්ල එයාල දෙන්නටත් ලැබුණනේ...

# 10

## ඉවුම් පිහුම් පන්තියක්

අම්මලා තේ බීලා අස්පස් කරලා කෝප්ප ටික සේදුවා. අත්තම්මා වැලෙන් කඩන් ආපු බුලත් කොළ ටික වට්ටියට දාලා පුවක් ගෙඩි දෙකතුනකුත් සුද්ද කරලා ලියන්න ගත්තා. ඊට පස්සෙ අම්මලාට විට වට්ටිය දුන්නා ''කන්න දූවේ විටක්...'' ''නැන්දේ අපි යන්නත් ඕනැ... පුතාලයෙ අප්පච්චිලා ගෙදර එනකොට උයලා තියන්නත් එපැයි...''නිපුනිගේ අම්මා කිව්වේ අනිත් අය දිහාත් බලමින්.

'අපෙ අප්පේ.. පුතේ එහෙම යන්න දෙන්න පුළුවනැ.. අද මේ දරුවො ඉස්ඉස්සල්ලාම මයේ ගෙදර ආපු දවසෙ බත් කටක් නොදී අරින්නෙ කොහොමෙයි... මං විගහනියට මොකුත් උයලා පිහලා ගන්නං. ඒ දරුවන්ටත් බත් ටිකක් ගෙනියන්න බැරුවයැ...''

''අපොයි.. නැන්දෙ නැන්දට කරදර කොරන්න බැ මේ වෙලාවෙ... අනික බත් ටිකක් කාල යන්න ආයෙ දවසක එන්න බැරියැ නැන්දෙ...''

''නෑ... නෑ... දූවලා බය වෙන්නෙපා... මං විගහින්



Scanned by CamScanner

උයන්නම්... අත්තමට... කයියට... පනහකට හැටකට විතර ඇඹුල උයාපු මට ඕක මොකද්ද දරුවනේ මෙහෙම කියපු අත්තම්මා අම්මලා දෙන්නෙක් එක්ක පිළිකන්නේ කොස් ගහ යටට ගියා... කෙක්ක ගෙනත් දීපු අත්තම්මා "අනේ දුවේ මට දැන් පේනවා අඩුයි, හොඳට පැහිච්ච කොස් ගෙඩියක් බලලා ඔය කෙක් බලට්ට දාලා අදින්නකො..." අම්මලා දෙන්නාට කිව්වා. හොඳට පැහිච්ච ලොකු කොස් ගෙඩියක නැට්ටට කෙක්ක පටලවලා ඇද්දා. ගහ මුල වැටුණු කොස් ගෙඩිය දෑතට ගත්ත මලින්ගේ අම්මා "නැන්දෙ අපි කොස් ගෙඩිය කපල ගන්නං.. තම්බන්නද... කිරිකොස් මාළුවටද?" ඇහුවේ අත්තම්මගෙන්.

"නෑ දුවේ... ඒ දෙකටම නෙමෙයි... "එහෙනම් මැල්ලුමටද? මැල්ලුමට නං පැහිල වැඩියි නේද නැන්දෙ?"

"නෑ දුවේ මැල්ලුමටත් නෙමේ.. අද අපි හදමු කොස් නියඹලාවක්..." අත්තම්මා හිනැහෙමින් කිව්වා.

"අනේ නැන්දෙ කොච්චර අපූරුද? අහලා තිබුණාට කවදාවත් කාල නෑ..." ඒ සනුලිගෙ අම්මා "අපිත් කාල නෑ නේද නංගියෙ," කට්ටියම කතා වුණා.

"ඒකනෙ දුවේ, මං කියා දෙන්නම් බත් මරන්න පුළුවන් නියඹලාවක් හදන හැටි... මං මෙච්චා ඉගෙන ගත්තේ, පුංචි කාලෙ අපේ කිරි අම්මා උයනවා බලන් ඉඳලා. අනෙ අප්පේ... උන්දැගෙ අත්ගුණේ.. උන්දෑ ලුණු ඇඹුල් දාපු හොද්දක් මාළුවක් ගෑවුණු ගෑවුණු තැන කතහැකි. මට මතකයි ඉස්සර උන්දෑ

තරම් උයන්න පිහන්න හපනියක් අහළ ගං හතකවත් හිටියෙ නෑ. ගමේ කොහෙද දානයක් තියෙන්නෙ උන්දෑ යනවා කොහිලඅල, අඹ, සුදුළූණු, මඩු දළු වගේ මාළුවක් උයාගෙන.. වෙනේකක් තියා දූවේ, හාමුදුරුවොත් හරිම මනාපයි කිරි අම්මගෙ කෑමවලට.. අනෙ අප්පේ... උන්දෑ බුදුන් දැක නිවන් දකින්නෝනෑ...'' අත්තම්මා පහත් වෙලා රෙදි පොටින් කඳුළු පිහගත්තා.

තාරකගෙ අම්මා පොල් ගානවා. තවත් අම්මලා දෙන්නෙක් කොස් ගෙඩිය කපලා මදුළු ගලවනවා. මලිත්ගෙ අම්මා අත්තම්මා දුමෙන් අරන් දුන්න වැව් කරවල සෝදනවා. අත්තම්මා ගිහින් වත්තෙන් තැල් කොළයි, තිබ්බටුයි, කොච්චියි කඩාගෙන ආවා. කොළඹ දරුවන් ආපු දවසට ඇරෙන්න අනිත් හැමදාම පාළුවෙන් පිරුණු අත්තම්මගෙ පුංචි කුස්සිය අද නම් මගුල් ගෙදරකට සැරසෙනවා වගේ ඒ විතරක්ද අත්තම්මගෙ උතුරන හිනාවෙන්, අම්මලාගෙ හිනාවලින් විහිළුවෙන්, කතාවෙන් පිරිලා.

අත්තම්මා අම්මලාටත් කියා දෙමින් එක සීරුවට කොස් තියඹලාව හදනවා. අම්මලා ටික බොහොම උනන්දුවෙන් වටවෙලා බලන් ඉන්නවා. හරියට සූපශාස්ත්‍ර පන්තියක් වගේ. තියඹලා, ඇඹුල, බැදුම්, සම්බෝල මේ හැමදේම අද දවල් බතට පුංචි කුස්සියෙ සුවඳ ගගහා ඉදෙනවා.

ඒ සුවඳ පුංචි කුස්සියෙන් මුළු වත්තටම පැතිරිලා ගියා. දෙල්ගහ යට සෙල්ලම් ගෙදර හිටපු පොඩ්ඩො ටිකට ඒ සුවඳ දැනුණේ බඩගින්නකුත් අවුලුවාගෙනමයි. කොච්චර කැවිලි කාල හිටියත් ඒ



Scanned by CamScanner

සුවඳට කටට කෙළත් ඉනුවා.

"අද නම් අත්තම්මා මඟුල් ගෙදරකට වගේ කෑම උයනවා..."

සඳුන් කීවේ කුස්සියෙන් නාගින දුම කඳ දිහා බලාගෙන. කට්ටියට දැන් නම් තවත් සෙල්ලම් කරන්න හිතක් නෑ වගේ. කෑම සුවඳ ඒ තරමම පුංචි යාළුවන්ට කරදර කරනවා.

"අපිත් යමුද ඒ පැත්තට..." මලිත් ඇහුවේ කට්ටිය තමන්ට විහිළු කරාවිද කියන දෙගිඩියාවත් හිතේ තියාගෙනයි.

"හරි... හරි... අපි යං" තවත් නම් ඒ සුවඳ ඉවසගෙන ඉන්න බැරි තරම්. බඩගිනි නමුදාව එකපාරටම කුස්සියට කඩා වැදුණා.



Scanned by CamScanner

11

# තේරුම් මාළු

හ්ම්... අම්මෝ සුවඳ... හරියට පන්සලට පේරු දානෙ උයන දවසට වගේ. අත්තම්මා කෙසෙල් කොළ එලාපු ලොකු වට්ටියක උණු බත් හැන්දෙන් තුනී කරමින්, කැට පොඩි කරනවා. අම්මලා එක එක මාළු පිනි දීසිවලට බෙදනවා.

''ආ.. කට්ටිය මොකද මේ පැත්තෙ? බඩගිනිද?'' මලිත්ගෙ අම්මා හිටිහැටියෙ කඩා වැදුණු පොඩි හමුදාවෙන් ඇහුවා. ''අත්තම්මගෙ කෑම සුවඳ අපේ බඩගින්න වැඩි කෙරුවනේ...'' ''අනේ පුතේ, අද අත්තම්ම විතරක් නෙමේ, පුතාලයෙ අම්මලත් හරි හරියට මාළු පිනි ඉව්වා...'' අත්තම්මා කිව්වා. ''අනික පුතේ බතට මාළු බඩගිත්ත කියනවනේ... එහෙනං අපි කාල හිටිමු.''

''අත්තම්මෙ, අද කට්ටියත් වැඩි හින්දා අපි පිල උඩ ඉඳගෙනම කමුද? නිපුනි ඇහුවා. ''ආ... පුතේ ඒක යසයි... මේකෙ ඇතුළෙ හිරවෙලා කනවට වැඩිය පිල උඩ කොච්චර හොඳද... හුළං ටිකකුත් වැදි වැදී නිදහසේ කතහැකි නේද? එහෙනම් පුතේ, මේං මේ



Scanned by CamScanner

පැදුරු එළන්නකො පිල උඩින්'' කියමින් අත්තම්මා, පැදුරු ආනෙන් පැදුරු දෙක තුනක් අරන් පොඩ්ඩන්ට දුන්නා.

''හා... හා... පැදුරු එළලා ගිහින් කට්ටියම මූණකට හෝදගෙන එන්න ඕන'' තාරකගෙ අම්මා කිව්වේ කට්ටියටම අමතක වුණු දෙයක් මතක් කරන්නයි.

ළිඳ ළඟට ගිහින් මූණ සෝදගෙන ආපු යාළුවන්ට තමන්ගෙ ඇස් අදහාගන්න බැරිවුණා. පිල උඩ එළාපු පැදුරුවල තිබ්බ ව්‍යංජන ගොඩ දිහා බලපු මලින්ට ''බුදු අම්මෝ.. අද නම් කාලා නැගිටින්න බැරිවෙයි'' කියවුණා. හැමෝටම හොඳටම හිනා. හැබැයි මලින්ගෙ අම්මා නම් පුට්ටක් විතර මලින්ට රැව්වා.

''ඉතින් නැගිටින්න බැරි නම් ඕං ඔය පිල උඩින් ඇලවෙලා බුදියාගන්න එකනෙ ඇත්තෙ...'' අත්තම්මාත් හිනාවෙවී කිව්වා. පැදුර මැද සුදු කැකුළු බත් දීසියක්, ඒ වටේට කොස් තියඹලාව, තැල්කොළ ඇඹුල, තිබ්බටු මැල්ලුම, කජු මාළුව, වැව් කරෝල බැදුම, අබ කොළ සම්බෝලය, හරියට තමන් දිහා හිනා වෙවී බලන් ඉන්නවා වගෙයි පොඩ්ඩන්ට පෙනුණේ.

අම්මලා යාළුවො ටිකට පිඟන්වලට බත් බෙදලා දීලා පුංචි නංගිලා මල්ලිලාට බත් කවන්න ගත්තා. කොච්චර පෙරැත්ත කළත් අත්තම්මා කන්න ගත්තෙ නෑ අම්මලා කනකම්. ඔන්න පොඩ්ඩන්ට ප්‍රශ්න කෝටියයි.

''මේ මොනවද, මෙ කහපාට තලපෙ වගේ ජාතිය? කොච්චි කරල් කැලිත් තියනව වගේ...''



Scanned by CamScanner

''අත්තම්මෙ, මේ මොනවද කොළ ජාතිය? ටිකක් සැරයි වගේ...''

''අපෙ අප්පෝ... පැටවුනේ අද දවල් බතට තේරුම් මාලුත් තියනවා නෙවැ''

''මොනවා... තේරුම් මාලු... කෝ ඒ මාලුව ආත්තම්මේ?''

''අනේ පුතේ තේරුම් මාලුව කියන්නෙ ව්‍යංජනයක් නෙමේ පුතේ... හිටින්ටකෝ මං කියල දෙන්න. ඉස්සර මගුල් තුලාවලදී මනමාලයගෙ හරි මනමාලිගෙ හරි ගෙදර මගුල් මේසෙට තේරුම් මාලුවක් හදනවා. ඒ කියන්නෙ පුතේ සාමාන්‍යයෙන් අපි උයන්න ගන්නෙ නැති ඔය මොනවහරි දෙයක් හොයන්න බැරි වෙන්න මාලුවක් හදලා අනිත් මාලු පිනිත් එක්ක මගුල් මේසෙට අරිනවා. අනිත් පැත්තෙන් ආපු කාණ්ඩෙ ඒ මාලුව මොකද්ද කියල තෝරන්න ඕනෑ. ඉතින් ඒ කාණ්ඩෙ ඉන්න දැනමුතු අය හෙම නා නා ප්‍රකාර දේවල්වල නම් කියනවා. හරියට කියාගන්න බැරි වුණොත් ඒ අය පරදිනවා.''

''ඉතින් අත්තම්මත් තේරුම් මාලු කාලා තියනවාද?''

''අනේ නෑ පුතේ, හැබැයි මට මතකයි ඒ කාලෙ මගුල් ගෙවල් කීපෙකම කොහොල්ලෑ මාලුව, කොස් දළු මාලුව, පුවක්මල් මාළුව වගේ දේවල් තියලා තිබුණා. ගොඩක් වෙලාවට තෝරන්න බැරි වෙනවා. ඒක පුතේ කරන්නෙ දිනන්නම නෙමේ... විනෝදෙටයි, කාණ්ඩ දෙකේ නෑදෑයො අතරෙ යාළු මිත්තරකම් ඇති කරගන්න එහෙම දාපු පුංචි පහේ



Scanned by CamScanner

උපායවල් තමයි ඔය..."

"එතකොට අත්තම්මෙ, මේ මාලු දෙකටත් ගත්තෙ උයන්න ගන්න ජාති නෙමෙයිද?"

"අනෙ අප්පේ නෑ පුතේ. මේ මාලුවට ගත්තෙ නම් ඔයාලා හොඳට කාල පුරුදු දෙයක් හොඳට බලන්න..."

"ම්... මේකෙ එන්නෙ නම් නිකං කොස් කොස් වගේ රහක්. හැබැයි කැලි නම් නෑනේ" තාරක කියද්දි අම්මලා කට්ටියටම හිනා ගියා.

"පුතා දිනුම්! ඕකට කියන්නෙ කොස් නියඹලාව. ඕං දැන් අම්මලත් දන්නවා හදන්න. පුතාලට ගෙදරදි ආයෙ හදල දෙයි."

"එතකොට අත්තම්මෙ, කොළ සම්බෝලෙ" නිපුනිට ඉවසිල්ලක් නෑ ඒවයෙ නම දැනගන්නකම්.

"ඒ පුතේ අඹ කොළ. අඹ ඇට හැදෙන පැළවල කොළ තමයි ඔය. රසයි නේද පුතේ?"

"රසයි අත්තම්මෙ, හැබැයි ටිකක් සැරයි..."

"ඒ අඹ කොළවල හැටි පුතේ..."

ඔන්න ඔහොම කට්ටියම වෙනදාට වැඩියෙන් බඩවල් පිරෙනකම්ම බත් කෑවා. අම්මලා අස්පස් කරන අතරේ අත්තම්මා කෙසෙල් අගිසි කීපයකුත් කපාගෙන කුස්සියට ගොඩවුණා.

"මේ මොකටද නැන්දෙ?"

"ඇයි පුතේ දරුවන්ගෙ අප්පොච්චිලාට බත් ටිකක්



Scanned by CamScanner

ගෙනියන්න. ඇයි මේ දූවලගෙ අම්මලා අප්පොච්චිලා හෙමත් ඉන්නවානේ ගෙදර... දූවලා කියපු විදියට ඒ ගොඩක් අය මාව දන්නවනේ... මට කාලෙකින් සිල් සමාදන් වෙන්න යන්න බැරි වුණානේ... ඉතින් දැන් වැඩිය මූණ ගැහෙන්නැනේ... වෙලාවක මාත් එන්නම්කෝ.. දූවල හැමෝගෙම ගෙවල්වල..."

"අප්පේ... නැත්දෙ එහෙනම් නැන්දව ගෙවල්වල නවත්තගන්න කට්ටියම පොරකයි. නේද අක්කා..."

"ඒක තමයි නංගියෙ..."

කෙසෙල් අගිසි ගින්දරට අල්ලලා තවාපු අත්තම්මා ඒවා අම්මලාට දුන්නා.

"දූවලා කැමති විදියට බෙදාගන්න ඔය තියන්නෙ ඕන තරම් බත්, මාලු පිනි" අම්මලා කෑම බෙදන්න ගත්තා.



Scanned by CamScanner

# 12

## අත් බෙහෙතේ ගුණ

එකපාරටම හයියෙන් අඬන සද්දයක් ඇහිලා කට්ටියම කලබල වෙලා. නිපුනි නංගිවත් උස්සගෙන එනවා. අනිත් කට්ටියම පස්සෙන් එනවා.

"මොකෝ පුතේ වුණේ... අනේ කියන්නකෝ" නිපුනිගෙ අම්මා හොඳටම බයවෙලා. "නෑ අම්මෙ, මේ වත්තෙ ඇවිදිද්දි කට්ටක් ඇනිලා..."

"අම්මේ මං බයවෙච්ච තරමක්, කෝ ඉන්න චූටි දූ මං හිමීට කට්ට ගන්නම්..." කියලා අම්මා නංගියව වඩා ගත්තා. තාම පුංචි ඇස් දෙකෙන් කඳුලු බේරෙනවා.

"කෝ බලන්න පැටියෝ... කොතනද කටුව ඇනුණෙ" සනුලිගෙ අම්මා ළං වෙලා ඇහුවා. "මෙතන..." චූටි නංගියා ඇඟිල්ලෙන් යටි පතුල පෙන්නුවා.

"හරි පුතේ හරි... අපි කටුව ගනිමු..." කියලා අම්මා ඇඳුමේ තිබුණු හැට්ට කටුවක් ගලවලා ගත්තා. නංගිවත් වඩාගෙනම පිල උඩ ඉඳගත්තා. හැට්ට

කටුවෙන් කකුලේ කටුව ඇනුණ තැන ටිකක් පාදන්න හදනකොටම නංගි හයියෙන් කෑගහන්න ගත්තා.

"අනේ දූවේ දරුවා අඬවන්න එපා... ඩිංගක් ඔහොම හිටින්නකෝ..." කියපු ආත්තම්මා ඉක්මනින් ඇළ අයිනට දුවලා කිරි වෑස්සෙන ගොඩ කදුරු කොළ දෙකතුනකුත් කඩාගෙන ආපහු ආවා.

"මේ ගොඩ කදුරු කිරි දැම්මාම කටුව හොඳට පෑදෙනවා. එතකොට ගන්න ලේසියි." කියලා පිල උඩ ඉඳගෙන නංගියාගෙ කකුල උකුල උඩින් තියාගත්තා. නිපුනිගේ අම්මගෙන් තිමිට කටුව ඉල්ලාගත්තා. "ආං... ආං... අර බලන්න පුතේ අර දෙල් ගහේ මොකාද ඉන්නෙ" කියලා නංගිට දෙල්ගහ උඩ පෙන්නුවා. නංගි ඒ දිහා බලනවත් එක්කම කටුව ඇනුණ තැන හිල් කරලා ගොඩ කදුරු කිරි ටිකක් එතනට දැම්මා. පුංචි නංගි අඬන්න හැදුවත්, වටේ හිටපු අයියලා අක්කලා එයාට වටේ පිටේ එක එක දේවල් පෙන්නන්න ගත්තා. නංගි කෙඳිරි ගාමින් ඒවා බල බලා ඉන්න අතරේ අත්තම්මා හැට්ට කටු තුඩෙන් කටුව අරගෙන මේං කට්ට ගත්තා මයෙ පුතේ... දැං හරි.." කියලා නංගියාගෙ ඔළුව අතගෑවා. හැමෝටම හරි සතුටුයි. "කොච්චර හොඳද නැන්දේ, අපි කටුව ගන්න ගියා නම් අද මෙතන අඬලම හෙම්බත් වෙනවා" නිපුනිගෙ අම්මා කිවුවා.

"ඒකනෙ පුතේ, ඔය පුංචි පුංචි අත්බේත් දැනගෙන ඉන්න එක කාටත් පොරෝජනයි. ඔය පුංචි ඇයො නිතරම වැටිල තුවාල කරගන්නවනේ. ඒ වෙලාවට ඔය කුරුම්බැට්ටියක් අහුලගෙන ලුණු වතුරෙන් ගලගාලා තුවාලෙ ගාන්න ඕනෑ. ටිකක් දැවිල්ලයි තමයි. හැබැයි



Scanned by CamScanner

පුතේ මොන බේතටත් වැඩිය ඉක්මනින් වේලෙනවා පැහැවෙන්නෙත් නෑ. එතකොට ඔය ඇඟිල්ලක් හෙ කැපුණාම ලේ ගලනකොට කෝපි දළු ටිකක් තල තුවාලෙන් තියල බඳින්නෝන. එහෙම නැත්නම් ඔය පැළ පොල්ගස්වල පොල් අතු මුල තියනවා ඉරු පාටට කුරුට්ටක්. අන්න ඒ කුරුට්ට සූරලා තුවාලෙන් තියෙන්න. ටක් ගාලා ලේ නවතිනවා.''

''පිළිස්සුම් තුවාලවලට කුකුල් තෙල් ටිකක් කකුල් පිහාටුවෙන් ගාන්න ඕන. කුකුල් තෙල් හොයා ත්න බැරි නම් පුතේ එළඟි තෙල් වුණත් කාරි නෑ ඉතින්... අත් බේත්නම් සියගාණක් තියනවා පුතේ මේ දරුවන්ට සුහංගු වෙනවා නොවැ... ආයෙ අ දවසක තව ටිකක් කියා දෙන්නංකෝ.''

''නැන්දාගෙන් අද අපි කොච්චර දේවල් ඉගෙ ගත්තද? අළුත් මාළු පිනි හදන හැටි, අත් බේත් ජාති නැන්දට පින්සිද්ද වෙනවා නැන්දෙ'' නිපුනිගේ අම්ම කිව්වා.

''එහෙනං දැන් අපි යන්න බලමු නේද අක්කෙ ඒ මලිත්ගේ අම්මා.

කට්ටියම අත්තම්මට වැඳලා යන්න ලෑ වුණා. හැමදාම වගේ රත්නත්තරේ පිහිටයි දරුවන්ට'' අත්තම්මා කිවුවා. කඩුල්ල ළඟට වෙන ඒගොල්ලො එක්ක ආපු අත්තම්මා කට්ටිය ඉවුර දිගේ යන දිහා බලන් හිටියෙ දුකින් වගේ විතරක්ද, අත්තම්මා ළඟම ඉඳගෙන බලන් හිටපු මහත්තයටයි කකුලේ පැටලෙමින් හිටපු සේනියා ඒ දුක දැනිල වගේ.



Scanned by CamScanner

13

# නොසිතූ විපතක්

ඔහොම හෙමින් හෙමින් කාලය ගතවෙලා ගියා. එක දවසක් යාළුවො ටික අත්තම්මලගෙ කඩුල්ලෙන් ඇතුළු වෙනකොටම කලුමහත්තයා දුවගෙන ඇවිත් කෑකෙදිරි ගාන්න පටන් ගත්තා. හැබැයි වෙනදා වගේ නම් නෙමේ... මොකක්දෝ වෙනසක් තියනවා. ඌ ගෙවල් පැත්තට දුවනවා... ආයෙ යාළුවො ළඟට දුවනවා. මොකක් හරි කියන්න හදනවා වගේ. අත්තම්මත් පේන්න නෑ. යාළුවො ටික ඉක්මනට ගෙට දුවගෙන ගියා.

කලුමහත්තයා කෙළින්ම දුවගෙන ගියේ අත්තම්මගෙ කාමරේට. යාළුවොත් ඌ පස්සෙන් දිව්වා. ''අම්මේ... බෑ අප්පේ'' අත්තම්මගෙ කෙඳිරිලි හඬ! අනේ අත්තම්මා ඇඳ ළඟ බිම දිගාවෙලා.

''අනේ අත්තම්මෙ... මේ මොකද මේ...'' හැමෝම එක හඬින් ඇහුවා... ''ආ... මගෙ දරුවො ටික ආවද පුතේ... අනේ පුතේ මං ඊයෙ රෑ කාමරේට එනකොට ඇඳ කකුලෙ හැප්පිලා මාව වැටුණා. නැගිටින්න හැදුවා... හැදුවා... අම්මේ පුතේ... නැගිටගන්න බැරිවුණා. ඉතින් මෙහෙමම හිටියා... අම්මේ... කොන්ද



Scanned by CamScanner

නම් හරියට කැක්කුමයි පුතේ... අනෙ අම්මේ.." අත්තම්මා වේදනාවෙන් කෙඳිරි ගානවා. "ඉත්ත අත්තම්මෙ, අපි නැගිටුවන්නම්... බයවෙන්න එපා.." "අපි කට්ටියම අත්තම්මව උස්සමු.."

"අනේ බෑ පුතේ... පුතාලට බෑ" අත්තම්ම අමාරුවෙන් කීවා. "හරි... මට ආව හොඳ අදහසක්.. සනුලියි නිපුනියි ගිහින් වතුර ටිකක් ගෙන අත්තම්මට බොන්න දීලා අත්තම්මව බලාගන්න. අ ටක් ගාලා ගිහින් සිරිමල් මාමාව එක්ක එන්නම් කියපු මලිත් තාරකයි සඳුනුයි එක්ක දුවලා ගිය නිපුනියි සනුලියි අත්තම්මාට වතුර පොවලා ඔළු අතගගා ළඟට වෙලා හිටියා.

ටිකකින් සිරිමල් මාමා යාළුවොත් එක්ක දුවගෙ ආවා. එයාලට පස්සෙන් විනිතා නැන්දත් එයාලගෙ දුව සඳමලී අක්කත් දුවගෙන ආවා. "හත් දෙයියනෙ නැන්දම්මෙ.. මොකෝ මේ වුණේ" කියමින් සිරිම මාමාට කාමරේට ආපු ගමන් කියවුණා.

කට්ටියම එකතු වෙලා පරිස්සමට ආත්තම්ම උස්සලා ඇඳ උඩින් තිබ්බා. දැන් නම් එන්න එන් ආත්තම්මගෙ තුනටියෙයි කොන්දෙයි අමාරුව වැ වගේ."විනිතො... මං ඉක්මනට ගිහින් සුමනෙ අයිය වීල් එක කතා කරන් එන්නම්. නැන්දම්මට ඇඳු අන්දලා ලෑස්ති කරගන්න. කෝකටත් කොට්ටය හෙම ලෑස්ති කරගන්න. ඔයත් ලෑස්ති වෙන් කියලා සිරිමල් මාමා බයිසිකලෙන් ඉගිල්ලුණා. වෙලාවකින් අත්තම්මලගෙ ගෙවල් පිටිපස්සෙ දෙ පාරේ ආපු ත්‍රීවිල් එකක් මිදුලෙ නැවැත්තුවා. සුම මාමයි සිරිමල් මාමයි අත්තම්මව පරිස්සමෙන් උස්



Scanned by CamScanner

ගෙනිහින් ත්‍රීවිල් එකේ ඉන්දුවා. දෙපැත්තෙන් සිරිමල් මාමයි විනිතා නැන්දයි වාඩිවුණා. "දුවේ, මේ නංගිල මල්ලිලත් එක්ක දොරවල් වහලා අපේ ගෙවල් පැත්තට යන්න" ත්‍රීවිල් එක වේගයෙන් යන්න ගියා.

යාළුවො හැමෝගෙම ඇස්වල කඳුළු. "අඬන්න එපා නංගිලා, මල්ලිලා, අත්තම්මට බේත් අරන් ඉක්මන්ට එයි. අපි එතකල් ඉමු." සඳමලී අක්කා යාළුවන්ව අස්වැසුවා. කලුමහත්තයා හැමෝගෙම මූණු දිහා බලනවා. මිදුලේ ටයර් පාර ඉව කරනවා. පව්... ඌටත් දුක දැනෙනවා ඇති. යාළුවො ටික දොරවල් වහලා සඳමලී අක්කත් එක්ක එයාලගෙ ගෙදර ගියා.

පැයකට විතර පස්සෙ ත්‍රීවිල් එක ආපහු ආවා. යාළුවො ටික මිදුලට පැන්නා. "අනේ කෝ ආත්තම්මා..." ත්‍රීවිල් එකෙන් සිරිමල් මාම විතරක් බැස්සා. "පුතේ අත්තම්මව ඉස්පිරිතාලෙ නවත්ත ගත්තා. විනිතා නැන්දත් ළඟ නැවතුණා."

සිරිමල් මාමා සාක්කුවෙන් ගත්ත නෝට්ටුවක් සුමනෙ මාමාට දුන්නා "පිස්සුද මල්ලි?, එහෙම සල්ලි බලාපොරොත්තුවෙන් ආව නෙමේ මල්ලි. ආයෙ උවමනාවක් වුණොත් කතා කරන්නකො" කියපු සුමනෙ මාමා ත්‍රීවිල් එක හරවගෙන යන්න ගියා. යාළුවන්ට කතා කරගන්නත් බෑ. ඇඬෙන්න එනවා. හැමෝම සිරිමල් මාමා වට කරගෙන.

"අත්තම්මගෙ උකුල් ඇටේ බිඳිලලු පුතේ, හොළවන්නවත් එපා කීවා. පුතාලා ඒ වෙලාවෙ ආවේ අත්තම්මගෙ වාසනාවට... නැත්නම් මං කීයට හරි ඒ පැත්තෙ යනකම් කවුරුත් දන්නෑ... එහෙම වුණානම්



Scanned by CamScanner

අත්තම්මට තව අමාරු වෙන්න තිබුණා. දුවේ, අපි අත්තම්මටයි, අම්මටයි දවල් කෑම ගෙනියන්න ඕන. මොනව හරි උයාගම්මු."

"අනේ මාමෙ, අත්තම්මව දොස්තර මාමල බැලුවද? බේත් දුන්නද?" "ඇට බිඳුණම අනිත් ලෙඩවලට වගේ එක පාර බේත් දෙන්නෑ පුතේ... අත්තම්මගෙ උකුල් ඇටේ එක්ස්රේ එකක් ගන්නවා කීවා. ඒක බලලා තමයි ඒගොල්ලො තීරණය කරන්නේ මොනවද කරන බේත් කියලා."

"එහෙනම් දුවේ, අපි බතක් මාලුවක් හදාගම්මු. ආයෙ ඉස්පිරිතාලෙ යන්නත් එපැයි. අත්තම්මට නම් කෑම කන්න දෙයිද දන්නෑ. ඊයෙ රෑ ඉඳන්ම මුකුත් කාල නැතේ. ගිය ගමන් සේලයින් දුන්නා. කමක් නෑ කෝකටත් කෑම දෙකක් හදාගම්මු."

"අනේ මාමෙ අපිත් මාමටයි අක්කටයි උදව් කරන්නම්."

"එතකොට පුතේ, අම්මලා බයවෙන්නෙ නැද්ද පුතාල පරක්කු වුණොත්?

"නෑ මාමෙ අම්මලා දන්නවා අපි අත්තම්මලාගෙ ගෙදර ආව බව."

"හා පුතේ ඒක නෙමෙයි, දුවේ මේ මල්ලිලා නංගිලා එක්ක ගිහින් අත්තම්මගෙ ඇඳුම් දෙක තුනක් අරන් එන්න, ඇවිල්ලා අම්මගේ ඇඳුමක් දෙකකුත් ලෑස්ති කරලා දෙන්න"

සඳමලී අක්කත් එක්ක අත්තම්මගෙ ගෙදර ගිය යාළුවො ටික ඇඳුනුත් අරන් ආපහු ආවා. අනේ



Scanned by CamScanner

කලුමහත්තයයි සේනියයි පාර බලන් ඉන්නවා.

සඳමලී අක්කා විගහින් හාල් ටිකක් ගරලා ලිපේ තිබ්බා. සනුලි පරිප්පු ගරලා සෝදලා දුන්නා. නිපුනි එළුණු සුද්ද කරනවා. මලිත් හාල්මැස්සො කඩනවා. සඳුනුයි තාරකයි පාත්තියෙන් ගොටුකොළ කඩාගෙන ආවා. පරිප්පුයි හාල්මැස්සොයි ඒදලා පොල් ටික මිරිකන අතරේ බත ඉඳුණා. ලිප් දෙකේ වෑංජන දෙක තියපු සඳමලී අක්කා ගොටුකොළ ටික සෝදලා ලියන්න ගත්තා. සඳුන් කෙසෙල් කොළ දෙකක් කපාගෙන ආවා.

''දුවේ, කොළඹ මාමලගෙ නොම්මර ලියලා තියන්නෙ කොහෙද? පණිවිඩේ දෙන්න එපැයි?'' සිරිමල් මාමා ගේ ඇතුළෙ ඉඳන් ඇහුවා. ''ආ ඉන්න අප්පච්චි මගෙ පොතක ඇති. මෙං අප්පච්චි... මේ ලොකු මාමගෙ... මේ සුනීත නැන්දගෙ... මේ චූටි මාමගෙ...''

''අපි කෝකටත් ලොකු මාමට කෝල් එකක් දීලා ඉම්මු''

''අක්කෙ අපිත් ගිහින් එන්නම්...'' යාළුවො ටික යන්න ලෑස්ති වුණා. ''අනේ මල්ලියෙ, ඉඳලා බත් කාල යන්න'' සඳමලී අක්කා කිව්වා. ''අනේ බෑ අක්කෙ, තාම බඩගිනිත් නෑ. අනික මේ විස්තරේ අම්මලටත් කියන්න ඕන. එහෙනම් අපි යන්නම් අක්කෙ, යන්නම් සිරිමල් මාමෙ''

කියාගන යාළුවො ටික අත්තම්මගේ ගේ ගාවින් ඇළ ඉවුරට ආවා. සඳමලී අක්කත් ඒගොල්ලොත් එක්කම ඇවිත් කලුමහත්තයටයි සේනියටයි බත් දුන්නා.



Scanned by CamScanner

# 14

# හැමෝම දුකින්

ගෙදර ගිය යාළුවො ටික මේ ආරංචිය අම්මලාට කිව්වා. ''අනෙ අප්පේ... නැන්දට වෙච්ච දෙයක්'' කවුරුත් කම්මුලට අත තියාගෙන දුක් වුණා. අප්පච්චිලා ටික හවස හතර හමාරේ බස් එකේ ඉස්පිරිතාලෙ යන්න කතා වුණා. ''අනේ අපිටත් යන්න ඕන අත්තම්මව බලන්න...'' යාළුවො ටික පෙරැත්ත කළා. ''අනේ පුතේ, මෙච්චර ගොඩක් කට්ටිය ගියාම අත්තම්මටත් කරදරයි.. අනික් ලෙඩ්ඩුන්ටත් කරදරයි පුතේ... අනික ඇඳන් දෙකක් අතරේ තියෙන්නෙ පොඩි ඉඩයිනේ... අපි ඔක්කොම ගිහින් අත්තම්මා එක්ක කතා කරන්නෙවත් කොහොමෙයි. අපි හිමීට යංකො පුතේ පහුවෙලා'' ඒ සතුලිගෙ තාත්තා. යාළුවො ටිකගෙ මූණු මැළවුණා. ඇස්වලට කඳුළු පිරුණා. ඒක දැකපු අම්මලටත් දුක හිතුණා.

''අනේ, මේ දරුවො ටික එක්කත් ගිහින් නැන්දව පෙන්නලාවත් එක්කන් එන්න. එතන ගොඩක් වෙලා හිටියොත්නෙ කරදරයක් වෙන්නෙ. දරුවො ටික අත්තම්මව බලාපු ගමන් එළියට එක්කන් එන්න. වෙන මොනව කරන්නද? අනික නැන්දව ඔය වෙලාවට හරි ඉස්පිරිතාලෙ ගෙනියන්න ලැබුණෙ මේ දරුවො



Scanned by CamScanner

දැකපු හින්ද කියනවනේ''

අන්තිමට අනිත් තාත්තලා නැවතිලා සනුලිගේ තාත්තයි මලින්ගේ තාත්තයි දරුවො ටික එක්කගෙන යන්න කැමති වුණා. අම්මලා හැමෝම එකතුවෙලා නාරකලගෙ ගෙදර උයපු බත් මාලු පිනි මුල් දෙකකට බැඳලා ගෙනියන්න ගත්තා.

සිරිමල් මාමගෙන් වාට්ටුව අහගෙන තිබුණ හින්දා හොයාගන්න අමාරුවක් වුණේ නෑ. අත්තම්මා ඇඳේ හාන්සි වෙලා හිටියේ... පොඩ්ඩො ටික දැකපු අත්තම්මා අමාරුවෙන් උණත් හිනාවුණා. තාත්තලා දෙන්නා විනිතා නැන්දගෙන් විස්තර අහන අතරේ යාළුවන්ට අත්තම්මගෙන් අහන්න දේවල් මහගොඩයි.

''ඉතින් අත්තම්මෙ... දොස්තර මාමලා මොකද කිව්වෙ?'' ''අනේ රත්තරනේ, උකුල් ඇටේ බිඳිලා කියල ඔපරේසන් එකක් කොරන්න ඕනැ කීවා.''

''අනේ... ඒක ගොඩක් අමාරු එකක්ද?''

''දන්නෑ පුතේ ඒ ගැන කියන්න''

''අත්තම්මට හුඟක් රිදෙනවද?...'' දරුවො ටික අත්තම්මව අතගගා ඇහුවා.

''රිදෙනවදත් කියල අහනවා පුතේ... මුළු කොන්දම ඇදූම් කනවා... කොහොම හරි ඉවසගෙන ඉන්නවා පුතේ... අනේ මේ වගේ විපතක් වනේ වන හතුරෙකුටවත් වෙන්නෙපා...''

මේ වෙලාවේ ඉක්මනින් දුවගෙන වගේ එතනට ආවේ සිරිමල් මාමයි සඳමලී අක්කයි.

"ආ... පුතාලත් ආවද... ආ සමන් මල්ලි... කොහොමද? මේ දරුවො ටික හිටපු එක හොඳට ගියා... නැත්නම් තැන්දම්මට තව අමාරුවෙන්ට තිබුණා."

"ඒක තමා සිරිමල් අයියෙ..." සනුලිගේ තාත්තා කිව්වා. එක පාරටම එතනට ආවෙ යාළුවො කවදාවත් දැකල නැති මාම කෙනෙක්.

"ආ ලොකු අයියෙ... බලන්නකො වෙච්ච දේ..." සිරිමල් මාමා ඒ මාමට කිව්වා. "ඒක තමා සිරිමල්... මට කෝල් එක ලැබුණ ගමන්මයි එහෙන් පිටත්වුණේ. නංගියි මල්ලියිත් එන්න හැදුවා. තවත් පරක්කු වෙන හින්දා මං කිව්වා හෙට දිහාට එන්න කියලා" කියමින් ඒ මාමා අත්තම්මා ළඟට ආවා. අත්තම්මගේ අතකින් අල්ලගන ඔළුව අතගාන්න පටන්ගත්තා. "අම්මේ... මේ මොකද වුණේ...? " මාමා ඇහුවා. "අනේ... පුතේ... මාව වැටුණනේ..." අත්තම්මට ඉකිගැහුණා. "හරි හරි අම්මේ... අපි අම්මව කොහොම හරි ඉක්මනට සනීප කරගන්නවා අම්මේ... දැන් නාඬ ඉන්නකෝ"

"පුතේ මේ දරුවො ටික තමයි මාව කාමරේ වැටිලා ඉන්නවා දැක්කේ... මේ පැටව් ආවෙ නැත්නම් මට කොච්චර වෙලා එහෙම ඉන්න වෙයිද දෙයියො තමයි දන්නෙ පුතේ..."

"ආ... ඇත්තද... මේ ළමයින්ට බොහොම ස්තුතියි." යාළුවො ටික දිහා නොසැලකිල්ලෙන් වගේ බලපු ඒ මාමා කිව්වා. මූණෙ හිනාවක්වත් නෑ. යාළුවො ටික හෙමිහිට මූණෙන් මූණ බලා ගත්තා. ඊට පස්සෙ ඒ මාමා දොස්තර මහත්තයා හම්බවෙන්න ගියා. සිරිමල් මාමගෙත් මූණ හරි නෑ. අත්තම්මගෙ මූණත් දුකින් බරවෙලා වගේ.



Scanned by CamScanner

15

# ලොකු පුතාගෙ තීරණය

ටික වෙලාවකින් කොළඹ මාමා ආපහු ආවා. "ඩොක්ට කිව්වා ඔපරේෂන් එකක් කරන්න ඕනලු. මේ ගමේ ඉස්පිරිතාලවල ඔපරේෂන් ගැන එච්චර විශ්වාසයක් තියන්න බෑ. අනික අම්මා මෙහෙ ඉස්පිරිතාලෙ ඉන්න එක සිරිමල්ලටත් කරදරයක්. අපිට වුණත් නිවාඩු දදා නිතරම ගමේ එන්නත් බැහැනේ... මං කල්පනා කළේ අම්මව කොළඹ ගෙනියන්න. ප්‍රයිවෙට් හොස්පිට්ල් එකකට ඇඩ්මිට් කරලා ස්පෙෂලිස්ට් කෙනෙක් චැනල් කරලා ඔපරේෂන් එක කළැහැකිනේ... ඒක කාටත් පහසුයි... නේද සිරිමල්''

''ඔ... ඔව්... ඔව් ලොකු අයියෙ, ඒත් අයියෙ නැන්දම්ම වෙනුවෙන් මේ දේවල් කරන එක නම් අපට කිසිම කරදරයක් නෙමේ... ඒ ගැන අබමල් රේණුවක තරම්වත් සැකයක් තියාගන්න එපා. හැබැයි.. අයිය කියන්න වගේ කොළඹ රටේ ගෙවන ඉස්පිරිතාලෙක ඔය ඔපරේසන් එක ඉක්මනින් හොඳින් කරගන්න පුළුවන් වෙයි. ඒවල මීට වඩා පහසුකම් තියනවනේ. ඒක නැන්දම්මටත් පහසුවෙයි...''



Scanned by CamScanner

''අනේ ඔව් අයියෙ, නැන්දට හැමදාම වුණත් සාත්තු කරන්න උණත්, ඒක කරදරයක් කියල තුත්හිතකින්වත් අපි හිතන්නෙ නෑ. හැමදේටම වඩා වටින්නෙ නැන්දම්මව සනීප කරගන්න එකනේ.''

''ඔව්.. විනිතා මං ඒ බව නොදන්නවා නෙමෙ, සිරිමල්, මට තව එක උදව්වක් කරල දෙන්න. මං ආවෙ වෑන් එකේ. මට අම්මව අදම ගෙනියන්න පුළුවන්. සිරිමලුත් අපිත් එක්ක ආවොත් ලොකු උදව්වක්. මං හෙටම සිරිමල්ව ගෙනත් බස්සවන්නම්.''

''අනේ ලොකු අයියෙ, ඕක අහන්නත් දෙයක්ද. මං එන්නම්, ඒත් අයියෙ අපි යන ගමන් ගෙදර ගිහින් නැන්දම්මගෙ ඇඳුම් කාරිය ගන්න ඕන නේද?

''ආ... ඔව්... අපි යන ගමන් යං... මං ගිහින් අම්මගෙ ටිකට් කප්පවාගෙන ඒ වැඩ ටික කරගෙන එන්නම්. අම්මව කෙළින් කරවන්න එපා කිව්ව නිසා ට්‍රොලියක් ඉල්ලගන්න වෙයි.'' ''යං ලොකු අයියෙ... මාත් එන්නම්...''

මුකුත් කතාකරගන්න බැරිව ගොළුවුණු යාළුවො ටික හරිම දුකින් අත්තම්මා දිහා බැලුවා. හැමෝගෙම ඇස්වල කඳුලු. අත්තම්මගෙ මූණ කියාගන්න බැරි මොකක්දෝ අසරණකමකින් පිරිලා. සඳමලී අක්කගෙත් ඇස්වල කඳුලු. එකපාරටම යාළුවො ටික අත්තම්මව වටකරගත්තා. ''අනේ යන්න එපා අත්තම්මෙ.. අත්තම්මා ගියාම අපිට පාළුයි...'' පුංචි ඇස්වලින් එක දිගට ගලාගෙන ආපු කඳුලු එයාලා අල්ලාගෙන හිටපු අත්තම්මගෙ රැළි වැටුණු අත්වලට වැටෙනවා අත්තම්මට දැනුණා. හිනා

කටක් පුරෝගෙන හැමදාමත් ලෝබකමක් නැතිව දරුවන්ට ආදරය කරුණාව බෙදපු අත්තම්මාගෙ ඇස් දෙකෙනුත් කඳුලු දෝරෙ ගලනවා.

"අනේ රත්තරනේ,... ම... මං..." අත්තම්මාට කතා කරගන්න බෑ. මෙතෙක් වෙලා මේ හැමදේම දිහා නිහඬව බලා හිටපු සනුලිගෙයි මලිත්ගෙයි තාත්තලා දරුවො ටිකගේ හිස් අතගාමින් මෙහෙම කීවා. "පුතේ අත්තම්මා කොළඹ යන්නෙ ඉක්මනට සනීප වෙලා එන්නනේ.. අනික ඒ අත්තම්මගෙ ලොකු පුතානේ... ඒගොල්ලෝ අත්තම්මව ගෙනියන්න හදන්නෙ මීට වඩා හොඳ දොස්තරලා වගේම පහසුකමුත් තියන ඉස්පිරිතාලෙකටනේ... අපිට පුළුවන්නේ අත්තම්මව බලන්න කොළඹ යන්න..."

"ඒක තමයි පුතේ, අපිටත් තේරෙනවා පුතාලට දුකයි තමයි... ඒත් ඔයාලා අඬනකොට අත්තම්මටත් දුක වැඩීනෙ පුතේ... ඒ හින්ද නාඬ ඉන්න දැන්..." විනිතා නැන්දත් කීවා.

"පු... පුතේ.. ම...මං ඉක්මනට සනීප වෙලා එන්නම් රත්තරනේ... අනික හැමදාම එහෙ ගිහින් ඉම්මු කියලා දරුවො කීවට මං කැමති වුණේ නෑ. ඒත් මම මෙහෙම ඉද්දිත් බෑ කියන්න බෑනෙ පුතේ... අනික.. මේ අප්පච්චිලා කිවුව වගේ පුතාලට පුළුවන්නේ අම්මලත් එක්කම මාව බලන්න කොළඹ එන්න නේද මයෙ පැටවුනේ... හා ඉතින් නාඬ ඉන්න..."

සිරිමල් මාමයි කොළඹ මාමයි එතනට ආවේ අත්තම්මගෙ ටිකට් කපන්න අවශ්‍ය හැමදේම කරගෙන. එයාලා පිටිපස්සෙන් ඉස්පිරිතාලෙ සුළු



Scanned by CamScanner

සේවකයෙක් ට්‍රොලියක් තල්ලු කරගෙන ආවා. එයත් අනිත් අයත් එකතුවෙලා අත්තම්මාව පරිස්සමෙන් ට්‍රොලියට ගත්තා. විනිතා නැන්දා කබඩ් එකේ තිබුණ බඩු අස්කරලා බෑග්වල දාගත්තා.

"එහෙනං විනිතො අපි වෑන් එකේම ගෙදර යං... නැන්දම්මගෙ ඇඳුං කැඩුං ටික ගන්නත් එපැයි..." සිරිමල් මාමා කිව්වා.

කොළඹ මාමා ඇරෙන්න අනිත් හැමෝම ට්‍රොලිය පස්සෙන් ඇවිදගෙන ගියේ හරියට රූකඩ පෙළක් වගේ. මොනව කියන්නද මොනව කරන්නද කාටවත් හිතාගන්න බෑ. ඉස්පිරිතාලෙ ඉදිරිපිට නවත්තලා තිබුණ වෑන් එකට අත්තම්මාව පරිස්සමෙන් ඇතුළු කරලා කොට්ට තියලා සීට් එකක හාන්සි කෙරෙව්වා.

"එහෙනම් අපි යන්නම් මල්ලිලා.. දැන් ගෙදර ගිහිල්ලා මෙයාලව බස්සලා ආපහු කොළඹ යන්නත් එපායැ.." සිරිමල් මාමා කිව්වා.

"ඒක තමයි සිරිමල් අයියෙ, කොළඹට යනකොට රෑවෙයි මයෙ හිතේ... එහෙනම් මොනව හරි තිබුණොත් කෝල් එකක් දෙන්න අයියෙ... මෙන්න මගෙ නොම්බරේ.. පරෙස්සමෙන් ගිහින් එන්න... බුදුසරණයි..." සනුලිගේ තාත්තා සිරිමල් මාමට නොම්මරය දෙන ගමන් කිව්වා.

සීට් එකේ හිටපු අත්තම්මගෙ කකුල් දෙක අල්ලලා යාළුවො ටික වැන්දා.

"අත්තම්මා සනීප වෙලා එනකම් අපි බලන් ඉන්නවා" සනුලි කීවේ අත්තම්මාට වැඳලා නැගිටින



Scanned by CamScanner

ගමන් "පුතේ පුතාලා එනවනේද මාව බලන්න?"
"ඔව් අත්තම්මේ... අපි එනවාමයි"

අත්තම්මාත්, සිරිමල් මාමාත්, විතිතා නැන්දත්, සඳමලි අක්කාත්, කොළඹ මාමත් නංවාගත්ත වෑන් එක තාර පාරේ ඈතින් ඈතට නොපෙනී ගියා. වෑන් එක ඈත පුංචි තිතක් වෙලා බොඳවෙලා යන හැටි කඳුලු පිරුණු ඇස් දෙකෙන් බලාගෙන හිටපු දරුවන්ගෙ අතින් අල්ලගත්ත අප්පච්චිලා දෙන්නා නිහඬවම බස් නැවතුම දිහාට පියවර මැන්නා. කතා කරලා දරුවන්ගෙ හිත් පාරවනවට වැඩිය නිහඬව ඉන්න එක හොඳයි කියලා එයාලට හිතෙන්න ඇති...



Scanned by CamScanner

16

# අපිට මොනවද කරන්න පුළුවන්?

පසුවදා උදේ හැටම ගහ යටට එකතුවුණු ළමයින් නැගණියගේ මුහුණේ තිබ්බ සතුටක් නෑ. "නේහමිට මොකොහොමද උනේ?" නැගණියගේ මිත්‍රිල නැගුණු ප්‍රශ්නය අසුන් රනිලට දැමීය. "ඒක නරකයි. සිරිමල් මාමා අද ගෙදර එනකොට කඩේ වෙයි. මේ කඩේ වෙලා ඒ නැගෙන මිනිස් එලියේ" මලින් මෙසේතා කළා.

"ඒත්... මේ අදම එහේ යන එක හරි නෑ... අද ගේ ගොළුම් මාමා සිරිමල් මාමාට එන්නත් එපාට කිව්වේ... මට නම් හිතෙන්නේ ඒ මාමා ගෙයි එච්චර කැමති නෑ වගේ... කවිදාට මේ දීපා මාලුවෙන් නෑ... ඒ නිසා මේ අද නොකිව්වත් කොට රනු..." සඳුනි කිව්වා.

"ඒක නම් හරි... මටත් තේරුණා... ඒ මාමා ටිකක් නපුරුයි වගේ... නේහමිගේ ප්‍රශ්නේ තියෙන්නත් ඇති වගේ..."

"අනේ... එහෙනම් මේ විස්තර දැනගන්න මොකොහොමද අපේ නේහමිගෙ ගැන..." නිලූෂිගේ ප්‍රශ්න ගොඩ නෑ. "ටිකක් ඉවසල ඉන්නකෝ නිලූෂි... ගෙට

වෙනකල්..'' සඳුන් කීවේ වැඩිහිටියෙක් වගේ.

අද කාටවත් සෙල්ලම් කරන්න හිතක් නෑ. ගෙදර ගියත් කරන්න දෙයක් නෑ. අම්මලා කිරි අම්මලා කතා වෙන්නෙත් අත්තම්මාට වෙච්ච කරදරය ගැනමයි. ඒවා අහගෙන ඉන්නකොට හිතේ දුක වැඩිවෙනවා.

''දැන් කලු මහත්තයයි, සේනියයි කොහොම ඇද්ද?'' සඳුන් හදිසියේ මතක් වෙලා කිවුවා. ''අනේ.. සත්තු වුණත් උන්ටත් අපිට වගේම අත්තම්මා නැති පාළුව ගොඩක් දැනෙනවා ඇති. ඇයි ඉතින් හැමදාම අත්තම්මගේ තනියට හිටියෙ ඒ දෙන්නනේ.'' සනුලිටත් එයාලා ගැන දුකයි.

''ඒක නෙමේ... අපිට අත්තම්මා වෙනුවෙන් කරන්න දෙයක් ඇත්තෙම නැද්ද?'' මෙච්චර වෙලා කල්පනා කරමින් හිටපු තාරක ඇහුවා. ''ඒ කිව්වේ...?'' අනිත් හැමෝම ඇහුවා. ''නෑ... මම කිව්වෙ අත්තම්මා වෙනුවෙන් ගමේ ඉඳන් අපිට කරන්න පුළුවන් දෙයක්...''

''අපිට පුළුවන්නේ ඉඳහිට කෑම ටිකක් ගෙනිහින් සේනියටයි කලුමහත්තයටයි දීලා එන්න. එතකොට රත්තිටයි, හඳයාටයි තණකොළ ටිකක්, වතුර ටිකක් හෙම දීලා එන්න... ඇයි අත්තම්මගෙ මිදුල අතුගාලා දාන්න...'' මලිත් කියාගෙන කියාගෙන ගියා. ''හරි... හරි... ඒ අත්තම්මගෙ ගෙදරටනේ... මං කියන්නෙ එහෙම නෙමෙයි... අත්තම්මාට ඉක්මනට සනීප වෙන්න අපිට මොනවාද කරන්න පුළුවන්?''

ආයෙත් තාරක කිව්වා. ''ඉතින් අපි අත්තම්මට බේත් කරන්නද? සාත්තු කරන්නද? අත්තම්මා ඉන්නෙ



Scanned by CamScanner

අපට කොච්චර දුරින්ද?'' නිපුනිට නම් තේරෙන්නෙ නෑ.

''මෙ අහන්න කට්ටියම, අපට බැරිද අත්තම්මා වෙනුවෙන් පන්සලේ බෝධිපූජාවක් කරන්න?'' තාරක එයාගෙ යෝජනාව ඉදිරිපත් කළා.

''අන්න හරි.. නියම අදහස... හැබැයි බෝධි පූජාවක් කරනවා නම් දවස් හතක් එක දිගට කරන්න ඕන. අපේ අම්මලා කරන්නෙ එහෙමයි'' සනුලි කීවේ දැනමුත්තියක් වගේ...

''එහෙනම් අපි අම්මලාටත් කියමු. එයාලා දැනැත් ගිලන්පස ටික හදලා දෙයි. අපේ කිරි අම්මලා කියනවා බෝධිපූජා කෙම්මුර දවස්වල පටන්ගත්තාම අනුහස් වැඩියි කියලා. හෙට බදාදානේ. අපි හෙටම පටන්ගමු.'' සඳුන් කීවේ එයත් යමක් කමක් දන්නා බව පෙන්වන්නත් එක්ක.

Scanned by CamScanner

17

# මල් සුවඳයි පැන් සිසිලයි

වැවෙන් හමාගෙන එන සීතල සුළං රැලිවල හැපුණු බෝපත්වල සිලිසිලිය මළුව පුරා පැතිරුණා. පැන් කළ හතක් පුරවලා සුවඳ කුඩුයි පිච්ච මලුයි දාලා පේළියට තියලා අරලිය, නෙළුම්, වතුසුදු, රුක්අත්තන වගේ පාට පාට මල් වලින් මල් වට්ටි පිරිලා. පාට පාට මල්වලින් රටා දමලා ඒ වට්ටි හැඩ කළේ සනුලියි නිපුනියි. ගිලන්පස වර්ග වීදුරුවලට පුරවලා බත්දේසිවල තියලා සූදානම් කළේ තාරකයි, සඳුනුයි මලිතුයි. අම්මලයි කිරි අම්මලයි තමයි පිරිසිදුවට ගිලන්පස හදලා බෝතල්වලට දාලා දුන්නේ. කිරි අත්තලා හොයලා දුන්න බෙහෙත් කොළ ජාතිත් බත්දේසිවල තියලා අම්මලා බුදුගුණ කිය කියා කොඩිවැලුයි, මල්වැලුයි බෝධියේ අතුවල එල්ලනවා.

යාළුවෝ ලොකු හාමුදුරුවන්ට වැඳලා තමන් ආපු කාරණේ කීවාම උන්වහන්සේත් බොහොම උනන්දුවෙන් බෝ මළුවට වැඩලා බෝධි පූජාව පවත්වන්න පටන් ගත්තා. මල්, පහන්, සුවඳ දුම්, දැහැත්, ගිලන්පස බෙහෙත් පූජා කරලා සුවඳ පැනින් බෝධිය නාවලා, තෙරුවන් වැඳලා තාලෙට



Scanned by CamScanner

බෝධි වන්දනා ගාථා කීවා. සියළු දෙවියන්ට පින් අනුමෝදන් කරලා අත්තම්මාට සෙත් පැතුවා. ඒ විතරක් නෙමෙයි. ලොකු හාමුදුරුවො හදලා දුන්න සෙත් කවියකුත් කියලා අත්තම්මට සෙත්පැතුවා.

මේ වගේ එක දිගට දවස් හතක්ම නොකඩවා බෝධි පූජා පැවැත්වූවා. මේ දරුවන්ගෙ මේ උත්සාහය ලොකු හාමුදුරුවොත් නොසෑහෙන්න අගය කළා.

18

# අලුත් ආරංචියක්

ඔය අතරේ දවසක් සිරිමල් මාමලගෙ ගෙදර ගිය දරුවන්ට අත්තම්මා ගැන අලුත් ආරංචියක් අහන්න ලැබුණා. කොළඹ පුද්ගලික රෝහලක අත්තම්මගෙ ඔපරේෂන් එක කරලා දැන් ටිකට් කපලා කොළඹ මාමලගෙ ගෙදර ඇවිත්ලු. හැබැයි අත්තම්මගෙ වයස වැඩි නිසා හොඳ වෙන්න ටිකක් කල් යාවිලු.

මේ ආරංචිය ගෙදර ගෙනියපු පොඩ්ඩො ටික අත්තම්මව බලන්න කොළඹ යං කියලා අම්මලව කරදර කරන්න ගත්තා. "අනේ පුතේ... තාම අත්තම්මා ගෙදර ආව විතරයිනේ... අපි ටික දොහක් බලලා හිමීට යං..." වැඩිහිටියෝ කවුරුත් කිව්වා.

එක දවසක් සතුලියේ තාත්තා සතුලියේ ඇඳ ළඟට ඇවිල්ලා වාඩිවෙලා සතුලියේ ඔළුව අතගාන්න පටන්ගත්තා. නිදාගෙන හිටපු දරුවා දැකපු තාත්තට හරියට දුක හිතුණා. "පව්... අහිංසක කෙල්ල... අත්තම්මා ගැනම කිය කිය ඉඳලා නින්ද ගිහිල්ලා... දැන් ඉස්සර වගේ දඟකරන්නෙ හුරතල් වෙන්නෙ එහෙමත් නෑ. ඇහැරවන්නත් ලෝබයි



Scanned by CamScanner

කෙලි පැටික්කිව... ඒත් මේ ආරංචිය ඇහුවාම දෝණි ගොඩක් සතුටුවෙයි."

"පුතේ... පුතේ... නැගිටින්නකෝ.. මගෙ අම්මා.."

"ආ... අප්පච්චි උදේත් වෙලාද?" "නෑ... නෑ.. මගෙ පැටියෝ මං ආවෙ ඔයාට සතුටුදායක ආරංචියක් කියන්න" සනුලි ටක්ගාලා ඇඳෙන් නැගිටලා ඉඳගත්තා. "අද හවස සිරිමල් මාමා කෝල් එකක් දුන්නා දැන් අත්තම්මට ටිකක් හිටියට වැඩිය ගුණයි කියලා. අත්තම්මා පුතාල ගැන නිතරම අහනවලු. ඉතින් මං එහෙම්මම පුතාගෙ යාළුවන්ගෙ අප්පච්චිලත් හම්බෙලා කතා කරගත්තා පුතාලයි අම්මලයි එක්ක අත්තම්මව බලන්න කොළඹ යං කියලා..." "මගෙ හොඳ.. අප්පච්චි" "එතකොට කවද්ද අපි යන්නේ?" "අනිද්ද උදේම පිටත්වෙන්න ඕන පුතේ..." එදා රෑ සනුලිට නින්ද ගියෙත් නෑ.

19

# දිග ගමනක්

ඊයෙ සතුලිගෙයි තාරකගෙයි අප්පච්චිලා ගිහින් හන්දියෙ නිහාල් මාමගේ වෑන් එක කතා කරගත්තා කොළඹ යන්න. ඒ එන ගමන් ඇහැටුයායටත් ගිහින් සිරිමල් මාමවත් ගමනට කතා කරගත්තා. අද උදේ නම් යාළුවන්ගෙ ගෙවල් හරිම කලබලයි. පාර අයිනෙම තියන තාරකලගෙ ගෙදර තමයි වෑන් එක නවත්තලා තිබුණේ. අනිත් අය හාල්, පොල් ගෝනි, පලතුරු, කැවිලි පෙට්ටි හෙම අතින් කරින් උස්සගෙන ආවා. නිහාල් මාමත් අප්පච්චිත් ඒවා වාහනයට පැටෙව්වා. ඔන්න සිරිමල් මාමත් ආවා. "කෝ මාමෙ විනිතා නැන්දයි සඳමලී අක්කයි?"

"අනේ පුතේ, ඕං අද උදේම වී හැළියක් තම්බන්න අරන්.. අනික සේනියයි, කලුවයි රත්තියි පැටියයි ඒගොල්ලො ගියොත් බඩගින්නෙනේ.."

වෑන් එක පිටත් වුණේ යාළුවො හැමෝගෙම හිනාමල් පුබුදුවාගෙනයි. වෑන් එකටත් වැඩිය වේගෙන් එයාලගෙ හිත් අත්තම්මා ළඟට ඉගිල්ලෙමින් තිබුණා. පැය ගානකට පස්සෙ කොළඹට ළඟාවුණු වෑන් එක



Scanned by CamScanner

ආයෙත් අතුරු පාරකට හැරුණා. ලොකු ගේට්ටුවක් දාපු උස තාප්පයක් ළඟ වෑන් එක නැවතුණා. "නිහාල් අයියෙ මේ තමයි ගේ..." සිරිමල් මාමා කිව්වා. "කෝ මාමෙ ගේ..." සඳුන් ඇහුවේ ගෙයක් පේන්න තිබුණෙ නැති නිසයි. "ආ පුතේ දැන් ගේට්ටුව අරියි" කියලා බැහැපු සිරිමල් මාමා තාප්පෙ තිබුණු බොත්තමක් තද කළා.

ටිකකින් පොඩි ගේට්ටුව ඇරගෙන එළියට ආපු සීය කෙනෙක් එක්ක සිරිමල් මාම කතා කළා. "ආ... ජේමිස් මාමෙ... අද නැන්දම්ම බලන්න ගමේ කාණ්ඩෙ ඇවිත්... වෑන් එක ඇතුළට ගන්න ඕන..." "ආ... එහෙමද මහත්තය... ඉන්න මං ගේට්ටුව අරින්න..." එකපාරටම ලොකු යකඩ තහඩුවක් වගේ තිබුණු ගේට්ටුව බ්‍රාස් ගාගෙන උඩට යන්න පටන්ගත්තා. යාළුවො ටික පුදුම වෙලා බලන් හිටියා.

වෑන් එක වත්ත ඇතුළට ගිහින් නැවැත්තුවා... ලස්සනට ගානට තණකොළ කපපු වත්ත... ලස්සන මල් වැටවල්... හැමෝම වෑන් එකෙන් බැස්සා... විශාල තට්ටු දෙකේ ගෙයක්... එක පාරටම බල්ලෙක් බුරන සද්දෙට යාළුවො ටික ගැස්සිලා ගියා.

එදා අත්තම්මව අරන් ගියපු කොළඹ මාමා එළියට ආවා. "ආ... මේ යාළුවො කට්ටියම ඇවිත් ඉන්නෙ අත්තම්මව බලන්න... එමු එමු ඇතුළට..." අම්මලා ආයුබෝවන් කියාගෙනම ගෙට ඇතුල් වුණා. අප්පච්චිලයි සිරිමල් මාමයි, නිහාල් මාමයි ජේමිස් සීයයි වෑන් එකේ තිබුණු බඩු ගෙදරට අදිනවා.

"අම්මෝ... මේ මොනවද මේ..."



Scanned by CamScanner

"මේ මහත්තයා, හාල්, පොල් ටිකකුයි කැවිලි ටිකකුයි..."

"හරි ටික තමයි... මෙච්චර ගොඩක්...? මොකටද මෙච්චර කරදර වුණේ?"

"අනේ මහත්තයා... මොන කරදරයක්ද... මේ අපේ කුඹුරෙ, වත්ත පිටියෙ හැදෙන දේවලුයි, මේ පුතාලගෙ අම්මලා හදාපු කැවිලි ටිකකුයි තමා"

"අනේ මන්ද, සෑහෙන්න මහන්සි වෙලා"



Scanned by CamScanner

20

# සතුටු කඳුලු

මුලින්ම හැමෝටම ඕන වුණේ අත්තම්මාව බලන්නයි. කොළඹ මාමා පෙන්නපු කාමරේට කට්ටියම වැල නොකැඩී ගියේ අත්තම්මගෙ මූණ බලාගන්න තිබුණු නොඉවසිල්ලටමයි. අත්තම්මට නින්ද ගිහින්. "අත්තම්මේ, අත්තම්මෙ..." යාළුවො කතා කළා. "ආ... කවුද?" "අත්තම්මට ඇහැරුණා. "අනේ.. පුතේ..." අත්තම්මා ඇස් පිහිදාලා ආයෙත් බැලුවා. "අනේ රත්තරනේ.. මං හිතුවෙ මං හීනයක් දකිනවා කියලා මට මගෙ නේත්තරා දෙක අදහගන්න බැරිව ගියා... එහෙනම් මගෙ මැණිකලා ටික මං බලන්න ආව" අත්තම්මගෙ ඇස් දෙකෙන් කඳුලු ගලනවා.

"ඉතින් ඇයි අත්තම්ම අඬන්නෙ" "අඬනවා නෙමේ පුතේ... මේ සතුටු කඳුලු" ඒ දිහා බලාගෙන හිටපු අම්මලාගේත් ඇස්වලට කඳුලු ඉනුවා. ඉතින්, කවුරුත් අත්තම්මගෙ දුක සැප අහන්න ගත්තා. අත්තම්මා එදා ගමේ ඉස්පිරිතාලෙ ඉඳලා කොළඹ ආපු දවසේ ඉඳන් අද වෙනකන් විස්තර හැමදේම කිව්වා.



Scanned by CamScanner

"අපි එහෙනම් තේ ටිකක් බීල ඉමු නේද?" කාමරේට ආපු කොළඹ මාමා ඇහුවා. ඉතින් හැමෝම ඇවිත් ලොකුම ලොකු මේසෙ වටේ වාඩිවුණා. මගෙ අම්මෝ.. එහෙම කෑම ගොඩක්! කට්ලට්, පැටිස්, සැන්විච්, කේක්, බිස්කට්, මෙකී නොකී වෛවාරණ කෑම ජාතිවලින් මේසෙ පිරිලා. කෙසෙල්, ඇපල්, මිදි, දොඩම් පුරවපු කූඩෙකුත් තියනවා. වැඩ කරන ගැහැනු කෙනෙක් තේ පෝච්චියකුයි, කිරි, සීනි දාපු භාජනයි ගෙනත් තිබ්බා. ආයෙත් පලතුරු බීම දාපු වීදුරු වගයකුත් ගෙනත් තියලා යන්න ගියා. කොච්චර කෑම ජාති තිබුණත් යාළුවො කෑවෙ කීපයක් විතරයි. එයාලාට අම්මලා කියල දීලා තිබුණෙ එහෙමයි. යාළුවො හැමෝම බිව්වෙ නම් පලතුරු බීම තමයි.

"කෝ අයියෙ, අක්කල, පුතාල හෙම...?" සිරිමල් මාමා කොළඹ මාමගෙන් ඇහුවා. "ආ සිරිමල්... අක්කා වැඩට ගිහින්.. පුතාලා ඉස්කෝලෙ ගිහින්... ඔයගොල්ලො එනව කියපු නිසා මං අද නිවාඩු දාලා ගෙදර හිටියා."

යාළුවො ටික ආපහු අත්තම්මගෙ කාමරේට දුවගෙන ගියා. සාලෙ වගේම ඒ කාමරෙත් හරි ලස්සනයි. බිම මූණ පේන තරමට ටයිල් දිලිසෙනවා. අත්තම්මත් එක්ක කතා කරන ගමන් යාළුවො වටපිට බැලුවා. කාමරේ ලොකු පොත් රාක්කයක්... "අත්තම්මෙ මේ කාගෙද?" "ආ පුතේ.. මෙ අපේ මිණිබිරීගෙනේ... ඒ දැරිවි පොත් කියවන්න හරිම ආසයි... ඔය පොත් ගොඩක් මයෙ හිතේ රට ගිය වෙලාවල්වල අරන් ආපුවා..." අපේ යාළුවො මේ තරම් ලොකු පොත් රාක්කයක් දැක්කමයි.

"අනේ අත්තම්මෙ, අපි මේ පොත් චුට්ටක් අරන් බලන්නද?" සනුලිට ආසාවෙ බෑ.

"අනේ බලන්න පුතේ, මක්වෙනවද?" යාළුවො පොත් අරගෙන පෙරළලා බැලුවා. සිංහල, ඉංග්‍රීසි පොත් ගොඩක් තිබුණා. සමහර ඉංග්‍රීසි පොත්වල පිටුවක් එයාලා ලියන කොපි පොතක් තරම් මහතයි. සමහර පොත් උස්සන්න බැරි තරම් බරයි. සමහර පොත් හරිම සුවඳයි. තවත් පොත් වගයක ලස්සන පින්තූර එක්ක සුරංගනා කතා. අනේ... කොච්චර ලස්සනද? යාළුවො ටික හරියට වෙනම ලෝකෙකට ගියා වගේ. කට්ටියට අත්තම්මවත් මතක නෑ. ඒ ලස්සන ලෝකෙ කොච්චර වෙලා හිටියද කියලවත් කාටවත් දැනුණෙ නෑ

"කෝ මේ දරුවො ටික..." ඔන්න කවුදෝ මේ පැත්තට එනවා. "ඉක්මනට පොත් ටික දාමු. ඉක්මන් කරමු. ඉක්මන් කරමු." පොත් ටික ආපහු අහුරපු යාළුවො ටික අත්තම්ම වටේට රොක් වුණා. ඒත් අනේ චූටි නංගිලා මල්ලිලා තාමත් පොත්වල පින්තූර බලනවා. අම්මලා දෙන්නෙක් කාමරයට ආවා. "අනේ අනේ චූටි දුව, චූටි පුතාලා, ඔව අදින්නෙපා... තියන්න..." කියලා අම්මලා පොත් ටික හිමීට අරන් රාක්කෙන් තිබ්බා. ඒ අතරෙ අයියලා අක්කලා හොරු ටික වගේ හිමීට කාමරෙන් එළියට ගියා. පැටව් ටිකගෙ හොර වැඩේ දැකපු අත්තම්මටත් හොඳටම හිනා "පොඩි දරුවො ඔහොම තමයි" අත්තම්මට හිතුණා.

සාලෙට ආපු දරුවො ටික සැටියෙන් වාඩිවෙලා වටපිට බලන්න උණා. හිසට උඩින් එල්ලෙන පොකුරු

පහතේ එළිය සාලෙ පුරා රටා මවනවා. අප්පච්චිලා මාමලා ලොකු කතාවක්.

"ඒත් සිරිමල්... පොත්පත්වල තියෙන්නේ අම්මගෙ වයස වැඩි හින්දා ඇවිදින්න නැතෙන කල් හිටිලු. සමහර විට ඇවිදින්න පුළුවන් වෙයිද කියලත් නැතමලු."

"ලොකු අයියෙ... සිංහල බෙහෙත් කළොත් හරිද?"

"මාත් ඔය ගැන හිතුවා.. ඒත් කොහොමද ඕවා කරන්නෙ... හොඳ නැතත් හොයාගන්නත් එපැයි? ලබින ඔය පත්තු, තෙල් බෙහෙත් එහෙම ගාන්න හිතාර අරන් යන්න ඕන නේද?"

"මහත්තයා. අපිට නෑසෙන දේත වෙද මාමණ්ඩි කෙනෙක් ඉන්නවා සියඹලාගොල්ල පැත්තෙ... කැඩුම් බිඳුම්වලට ඒ පැත්තෙ හරි ප්‍රසිද්ධයි... පරම්පරාවෙ රහස් බෙහෙත් වට්ටෝරුවලින් තමා වෙදකම් කරන්නේ... හොඳක් අමාරු ලෙඩ්ඩුන්ව ගෙදර අරන් තියනවා... ලොකු මුදලක් ගන්නෙත් නෑ... මුලක් කොළේට කියන කිය හරි කමක් නෑ... දුප්පත් උදවිය සියාං පඩුරුත් ආපහු දීලා බෙහෙත් කරන්නේ... මං ඊයේ හෙට්ටා විස්තර කියලා බලන් එන්නම් මහත්තයා..." කිව්වේ කාරකොට අප්පච්චි.

"ගාන නම් ලක්ෂ ගාණක් ගියත් මට කමක් නෑ මල්ලී... මට ඕන අම්මව සනීප කරගන්න. ඔය කොයි පැත්තෙද ඔය වෙද මහත්තයා..."

"සියඹලාගොල්ල තියන්නෙ අයියෙ අපේ ගමේ ඉඳලා හැතැක්ම හය හතක් ඇති... බණ්ඩාරවැව

පුතාට වෙන්න" සිරිමල් මාමා කිව්වා.

"එත් සිරිමල්... එයා ගෙනියන්න නම් අම්මලා කැමතු නෑම් ගෙනියන්න එපැයි... අම්මා දැන් ඉන්න තත්වේ හැටියට නගරයට පිටත්වෙන්න බැහැනෙ... ඔළුවද නැති අම්මා පොඩ්ඩෙන් ලෙඩවෙන්නම් වෙනවා..."

"මැඩම්, අයියා... අපිට ඒ පුතාගෙන් කවුරුත් නැති වුණත් ගෙනෙනවට කොහොමදෝ... හැමෝගෙම සන්තෝසේ නැතිවෙනවා..." සෙනුලිගේ තාත්තා කිවුවා.

"එහෙම කෙනෙක් ඉන්නවා නම් සිරිමල් මං ගෙදර දුවගෙන ගිහින් පරීක්ෂා කරන්න ලැස්තියි... අම්මට කොහේත් බලාගන්නත් නැති"

"ඉන්වෙලත් ලොකු අයියා. අපේ පිටිපස්සෙ ගෙදර තියෙන ගස්වලින් ඉන්නවා මිස මින්ට්ය පුතෙක... මගුල්ගෙදර මිනැදිලා... දරුවෙක් නැ නැතිවම තමයි ඉන්නෙ... නම් හොඳ පාසල් මතුල්ලෙ... මං මෙහෙම කිව්ව හැක හොයන්නම්කෝ"

මේ අවිනාට නොතේරුණෙනි නැවත අම්මාගේ හමේ තට්ටිය රෝහලෙන් දවල් වෙද්දී ලැස්ති වුණ හැමෝම සතුටින් නැවත කාලා ගොලුයි මාමට ජයේ කළා. අන්තිමට වැදලා යාළුවෝ තට්ටිය පමව එන්න පිටත්වුණ ගිහ් පට දරලා පේන් පිලිගොනවාන්නටමත් එක්වයි.

21

# පුංචි ගෙදර කල එළියක්

පහුවදාම තාරකගෙ අප්පච්චියි සතුලිගේ අප්පච්චියි සියඹලාගොල්ලෙ වෙද මාමණ්ඩිලගේ ගෙදර ගියා. කොළඹ මාමගෙන් ඉල්ලගන ආපු, අත්තම්මගේ වෛද්‍ය වාර්තා එහෙමත් අරගෙනයි ඒ ගොල්ලො ගියේ. වෙද මාමණ්ඩිට වැඳලා හෙම, අප්පච්චිලා ආපු කාරණාව කිවා. අත්තම්මගේ එක්ස්රේ, වෛද්‍ය වාර්තා එහෙම ලෙඩෙක් බලන වෙලාව තරම්ම වෙලාවක් අරගෙන පරීක්ෂා කරපු වෙද මාමණ්ඩි... "හ්ම්... හ්ම්... අරගෙන එමුකො එහෙනම් ලෙඩාව... ඊට කලින් තියේ නම් උන්දැගෙ උපන් වෙලාව මට ගෙනත් දියල්ල... දැන් කොළඹ නෙවැ ඉන්නව කිව්වෙ... ලෙඩා ගේනකොට පරෙස්සමෙන් ගේන්ට ඕනෑ... උස්සද්දි පෙරළද්දි බොහෝම සීරුවෙන්..."

"හොඳයි වෙද මාමණ්ඩි... අපි එහෙනම් ගොහින් එන්නම්." අප්පච්චිලා ආපහු බක්මීවැවට ආවෙ මේ සතුටුදායක ආරංචිය ඉක්මනට දරුවො ටිකට කියන්නයි.



Scanned by CamScanner

මාරුවෙලා ගිය සිරිමල් මාමයි විනීතා නැන්දයි ආපහු ඇහැලියගොඩට ආවෙ ඊටත් වඩා සතුටකින්. ඒ මොකද විනීතා නැන්දලගෙ අර කියපු අක්කා අත්තම්මගෙ සාත්තුවට එන්න එක පයින්ම කැමති වෙලා. සිරිමල් මාමලා ආපහු ඇවිත් තියෙන්නේ පසුවදාම එයාව එක්කන් යන්න එනවා කියලා පොරොන්දු වෙලයි. හවස සිරිමල් මාමා මේ සතුටුදායක ආරංචි දෙකම කොළඹ මාමාට කෝල් කරලා කිව්වා. එයාටත් හරිම සතුටුයි.

එදා රෑම කොළඹ මාමගෙන් සිරිමල් මාමාට කෝල් එකක්... "සිරිමල්, මම නංගියි, මල්លියි එක්ක කතා කළා... අපි අනිද්දා උදේම මෙහෙන් පිටත් වෙනවා. අපට පුළුවන් වෙයි නේද, මද්දහන වෙද්දි වත් අම්මව වෙද ගෙදර ගෙනියන්න"

"අපෝ පුළුවන් ලොකු අයියෙ... සියඹලාගොල්ලට මෙහේ ඉඳන් විනාඩි විස්සක් යයි. අයිය බය වෙන්නෙපා... අපි ඒ ඔක්කෝම ලෑස්ති කරන්නම්. මං දැන්ම අර දරුවන්ගේ අප්පච්චිලා එක්ක කතා කරන්නම්."

"හොඳයි... සිරිමල් මේ කරන උදව්වලට සිරිමල්ට කොහොම ස්තූති කරන්නද?"

"අනේ ලොකු අයියෙ, නැන්දම්මා වෙනුවෙන් මීට වැඩිය දෙයක් වුණත් කරන්න අපි ලෑස්තියි"

සිරිමල් මාමා එවෙලෙම සනුලිගේ තාත්තට කතා කරලා මේ සතුටුදායක ආරංචිය එයාට කිව්වා. මේ



Scanned by CamScanner

ආරංචිය අහිත් යාළුවන්ගෙ ගෙවල්වලට ඉගිලිලා යන්න වැඩි වෙලා ගියේ නෑ.

පහුවදා උදේ අත්තම්මගේ ගෙදර හරිම කලබලයි. සිරිමල් මාමයි, අප්පච්චිලයි කට්ටියම වත්ත සුද්ද කරනවා. ගස් වල අතු කපනවා. වීසි ගහනවා. යාළුවො ටික පොල අතු ගොඩ ගහනවා. අතු ගානවා. හරියට කඩි රැළක් වගෙයි.

විනිතා නැන්දයි, මාරවැව ඉඳන් ආපු සිරියාවතී නැන්දයි, යාළුවන්ගේ අම්මලා කට්ටියයි ගේ අස් පස් කරනවා. පතුගානවා. එක පාරටම වුණු මේ වෙනස හිතා ගන්න බැරිවදෝ කොහෙද, කලු මහත්තයා බුරලා බුරලා හති වැටිලා බලන් ඉන්නවා.

පැයකින් දෙකකින්, පහුගිය ටිකේ පාළු පාටට තිබුණු අත්තම්මගෙ ගේයි, වත්තයි ආයෙත් කලඑළි වෙලා බලන්න ලස්සනයි.

* * *

ඉර වෙනදාට වැඩිය අද ඇහැටුයායට ලස්සනට පායලා. මල් පුවඳ පිරුණු නැවුම් සුළං රැළි හැම තැනම හමා යනවා. හැමදාම ඇහුණු කුරුල්ලන්ගේ කිචිබිචිය යාළුවන්ට ඇහෙන්නේ අලුත් සංගීතයක් වගේ. අම්මලා නම් හරිම කලබලෙන්. උදේන්ම අත්තම්මගෙ ගෙදරට ආපු අම්මලා අද පිලේ ජයටම මේ මේසයක් ලෑස්ති කරනවා අත්තම්මාව පිළිගන්න. හැමෝම දුවලා පැනලා වැඩ.

ඔන්න ටිකෙන් අප්‍රේල් මාසේ ආවා. වසරක් ගෙවුණු පාරෙන් ඇවිත් මිදුලේ නැවතුණා. හැමදාම වගේ මම එක ළඟට දුවලා ගියා. ... කඩු නැන්දලයි. ලොකු ... 'ලොකු එකකොට අත්තම්මා' ... කරලා තිබුණු අත්තම්මගෙ ... අරගෙන ... තිබ්බා. අනේ... යාළුවො ටික දුවලා ඇවිත් අත්තම්මව වදාගත්තා. අත්තම්මගේ ඇඳිලි ... ඒ කඳුළු අලුත් වුණේ ... ඇවිත් අත්තම්මගෙ කකුල් වලට වැන්දයි. ... බිම පෙරළෙන්නයි. ... යාළුවෙක් ... ඇවිත් අත්තම්මා ළඟින් තිබ්බා. එයත් "මෙච්චර කල් කොහෙද හිටියේ අත්තම්මෙ" කියන්න වගේ. "කෑව්" කියමින් කකුල්වල ඇතිල්ලෙන්න වුණා.

අප්පච්චිලා එකතු වෙලා පෙට්ටි පුටුව මිල ... ගත්තා. කොළඹ මාමලා නැන්දලා, ... හැමෝම පිලේ තිබුණු පුටුවල වාඩි වුණා. අම්මලා තේ මේසේ වැඩිං ඇවියා...

"මගේ අප්පේ දුවේ... හරි සාරයි කොහේ..." තේ මේසෙ පිරිලා තිබුණු කිරිබත්, කැවුම්, මුංගුලි, නැකි වළලු, තල, අලුවා, පුස්නාම්ප වගේ කැවිලි ... දැකලා අත්තම්මාට කියවුණා. "නැන්දා ආපහු ගම ආපු සතුටට තමයි" අම්මා හෙමෙත් කීවා.



Scanned by CamScanner

"එහෙනම් මහත්තයො අපි තේ ටිකක් බීලා ඉමු. උදේ පාන්දරින්ම නොවැ එන්න ඇත්තේ" අම්මා කෙහෙත් කට්ටියට වතුර අල්ලමින් කිව්වා.

හැමෝම සතුටින් තේ බීවා. කවදාවත් දැකලා නැති සමහර කැවිලි ජාති කොළඹ ලමයි කැවේ හරිම ආසාවෙන්. ටික වෙලාවකට පස්සේ අත්තම්මාව අරන් කොළඹින් ආපු වැඩිහිටියෝයි, සිරිමල් මාමයි තාරකගෙ අප්පච්චියි වෙද ගෙදර ගියා.

ඒගොල්ලෝ නැවත එනකන් කොළඹ යාළුවන්ට ගමේ ලස්සන පෙන්නන වැඩේ බාර ගත්තේ අපේ යාළුවෝ කට්ටියයි.



Scanned by CamScanner

# 22

## ලොකු තෑග්ගක්.

දැන් යාළුවන්ගේ හැම ගෙදරම වගේ පත්තුවෙන්, මැල්ලුමත්, කෑමත් නොකැඩෙන දවසක් නොයා යන්න බැරි තරම්... වෙද මාමා නියම කරන බෙහෙත් පත්තල විට්ටන්ගේ නැළවිලි පිහින් සොයාන එන්නේ අත්තොවිවිලා හරි කිරි අත්තලා හරි. ඊට මාරුවෙන් මාරුවට යාළුවන්ගේ ගෙවල්වලදී කෑමය. පත්තු, මැල්ලුම් වෙලා අත්තම්මගේ ගෙදරට එනවා. සිරියාවති නැන්දගේ දුවිවිය අම්මලයි, විනීත නැන්දයි නිතරම එනවා. අත්තම්මත් දැන් හරි සතුටින්.

මෙහෙම විත විත කාලය ගෙවිලා ගියා. දැන් අත්තම්මාට අත් වාරුවලින් විතක් ඇවිදින්න පුළුවන්. තොගෙ මාමලා, නැන්දලා ළමයි සතියකට දෙකට වතාවක් දැන් අත්තම්මලා බලන්න එනවා. දැන් ගමේ ඇයයි. ඒගොල්ලොයි එක ලොකු පවුලක් වගේ.

එක දවසක් ඒ මාමලයි නැන්දලයි යාළුවො විකට කතා කළා. "පුතේ, අපි මේ කතා වුණේ, අපේ අම්මා මෙච්චර සනීප වුණේ මේ දරුවනුයි. මේ දරුවන්ගේ දෙමාපියොයි නිසා තමයි පුතේ..."



Scanned by CamScanner

"ඉතින් අපි කල්පනා කළා පුතාලට මොනවා හරි ලොකු උදව්වක් කරන්න. පුතාලගෙ අනාගත අධ්‍යාපන කටයුතුවලට හරි, වෙන මොකක් දේකට හරි උදව් කරන්න අපි ලෑස්තියි. ඉතින් පුතේ... පුතාලම කියන්නකෝ අපි ඔයාල වෙනුවෙන් මොනවද කරන්න ඕන කියලා?"

යාළුවො ටික මොනවා කියන්නද? කාටවත්ම මුකුත් හිතා ගන්න බෑ. "මාමෙ අපි පොඩ්ඩක් කතා කරලා කියන්නද?" සඳුන් ඇහුවා. "හා.. හොඳයි පුතේ... ඔයාලගෙ කැමැත්තක්."

යාළුවො ටික එකතු වෙලා තීරණේකට ඇවිත් කට්ටියම ගියා මාමලා නැන්දලා හිටපු තැනට

"මාමෙ, නැන්දෙ, අපට කියලා වියදමකින් මුකුත් ඕන නෑ. ඒත් අපි කොළඹ මාමලාගේ ගෙදර ගිය වෙලාවෙ දැක්කා ඒ අක්කලගෙ, අයියලගෙ පොත් රාක්කයක්. අපි කවදාවත් දැකලා නැති පොත් ගොඩාක් ඒකෙ තිබුණා. අපිට කියවන්න ඉස්කෝලේ පොත් නෑ, මාමෙ නැන්දෙ... අපේ ඉස්කෝලෙ හරිම දුප්පත්... පිටකවර ඉරිලා ගිය, කැලි හැලෙන පොත් ටිකක් විතරයි ඉස්කෝලෙටම තියෙන්නෙ. මාමලාට පුළුවන් නම් අපේ ඉස්කෝලෙට පොත් ටිකක් අරන් දෙන්න. ඒක අපේ ගමටම කරන ලොකු උදව්වක් වෙයි." සඳුන් කියාගෙන ගියා.

ඒක අහගෙන හිටපු මාමලගෙ, නැන්දලගෙ ඇස්වලට කඳුලු ආවා.

"අනේ පුතේ, පුතාලගෙ ඉස්කෝලෙට අපි පොත් විතරක් නෙමෙ, පොත් රාක්කයි, පුස්තකාලයකුත් හදලා දෙනවා..."



Scanned by CamScanner

23

# පුස්තකාලය

ඔක්මියාය කනිෂ්ඨ විද්‍යාලයේ අද පුංචි උත්සවයක්. පාසලේ ගේට්ටුව ළඟ ගොක් කොළ තොරණක් "සාදරයෙන් පිළිගනිමු" කියලා ගොක් කොළ වලින්ම වියලා.

උදේ අටට විතර වෑන් එකක් තොරණ ළඟ නැවැත්තුවා. විදුහල්පතිතුමායි ගුරුමණ්ඩලයයි තොරණ යට සූදානමින් ඉන්නේ අමුත්තො පිළිගන්න. වෑන් එකෙන් බැහැපු කොළඹ මාමලාව, ළමයින්ව, ආත්තම්මාව විදුහල්පතිතුමායි ගුරුමණ්ඩලයයි ආයුබෝවන් කියලා පිළිගත්තා. ඒ අමුත්තන්ට පිටුපසින් අපේ යාළුවො ටික. මලිත්, සඳුන්, තාරක, සනුලි. නිපුනි.

"ඩුම්! ඩුම්! ඩුම්!" විදුහලේ පුංචි තූර්ය වාදක කණ්ඩායම වාදනය පටන් ගත්තා. තූර්ය වාදක කණ්ඩායම කිව්වට ඒකෙ තූර්ය භාණ්ඩ නෑ. තියෙන්නේ ටින්, පොල්කටු, ප්ලාස්ටික් බේසම්වලින් හදාගත්ත ආදේශ භාණ්ඩ. වාදනයත් එක්කම තූර්ය වාදන කණ්ඩායම අමුත්තන්වයි, යාළුවො ටිකයි අලුත්

පුස්තකාල ගොඩනැගිල්ල වෙත කැඳවාගෙන ගියා. පාර දෙපැත්තේම සිසු දරුවෝ පේළි හැදිලා, ඊට පිටුපසින් දෙමව්පියෝ, ගම්වැසියෝ.

විශාල කුඹුක් ගහ යට අඳෝ සුදට බබළන අලුත් ගොඩනැගිල්ල ළඟ හැමෝම නැවතුණා. රතු පාට පීත්ත පටියක් දොර හරහා ඇදලා. ගමේ පන්සලේ හාමුදුරුවෝ, පිරිස පන්සිල්හි පිහිටුවලා පිරිත් දේශනා කළා. කුඹුක් ගහේ වැදපු යකඩ කටින් නිවේදකයාගේ හඬ ඇහුණත් යාළුවන්ට ඒ කිසිම දෙයක් ඔළුවට ගියේ නෑ.

විදුහල්පතිතුමා දැරියක් ගෙනාපු බන්දේසියේ තිබුණු, පීත්ත පටියක් ගැට ගහපු කතුර අරගෙන කොළඹ ලොකු මාමා අතට දුන්නා. ලොකු මාමා ඒක අරගෙන ගියේ පීත්ත පටිය තිබුණු තැනට නෙවෙයි. යාළුවො පස්දෙනා ළඟටයි. යාළුවන්ට මුකුත් හිතා ගන්න බෑ. "ගන්න පුතේ, කට්ටියම කපන්න රිබන් එක..."

කතුර අතට ගත්තු යාළුවෝ ටික ගියේ අත්තම්මා හිටපු රෝද පුටුව ළඟට... හැමෝම අත්තම්මට වැඳලා කතුර අතට දුන්නා. දෙපැත්තෙන්ම අල්ලලා අත්තම්මාට වාරු දීලා පීත්ත පටිය ළඟට එක්කගෙන ගියා. "රිබන් පටිය කපන්න අත්තම්මේ..." අත්තම්මා රිබන් පටිය කැපුවේ හැමෝගෙම අත්පොළසන් මැද්දේ... ඒ හඬ මුළු ගම්මානය පුරාම පැතිරිලා ගියා. ඊට පස්සේ එල්ලලා තිබුණු දිළිසෙන සුදු තිරය අත්තම්ම අතින් විවර වෙද්දි අත්තම්මාට ඇස් අදහා ගන්න බැරි වුණා.

ඒ පුවරුව දිහා අත්තම්මා බලාගෙන හිටියෙ සතුටු

කඳුළු පිරුණු ඇස්වලින්

පුංචි යහළුවො අත්තම්මට තුරුලු වුණේ එක පොදියට

"මගෙ මැණිකලට රත්තරන්තරේම පිහිටයි"

අත්තම්මගෙ හඬ හැඬුම්බර වුණත් එහි තිබුණෙ පිරි ඉතිරී යන සෙනෙහසක්.

පුංචි පැටව් ටිකත් තුරුලුකරගෙනම බොඳවුණු ඇස්වලින් අත්තම්මා ආයෙත් බැලුවා අර පුවරුව දිහා.

හැමෝම තාමත් ඒ දිහා බලාගෙන ඉන්නෙ සතුට දරාගන්න බැරුව. කඳුළු අතරින් හැමෝගේම හදවත්වලින් ඇහුණෙ එකම හඬක්. ඒ

"අත්තම්මාගේ පුස්තකාලය"

නිමි.

Scanned by CamScanner

# දෙල් ගහ යට පුංචි ගෙදර

විජය - ගුණසේන
පොත් ලියන ඉස්කෝලේ 2019
නිර්මාණාත්මක යොවුන් නවකතා
ව්‍යාපෘතියෙන් ජයග්‍රහණය කළ
මෙම කෘතිය
සහෘද චින්තනයට
මින් පෙර නොවිඳි
අපූර්වත්වයක් එකතු කරයි.

පොත් ලියන ඉස්කෝලේ 2019

ISKOLE 2019

Scanned by CamScanner